


# පළිගැනීමේ ප්‍රහාර

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

# මැයි 9
# පළිගැනීමේ ප්‍රහාර

RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

**රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය**

2022 දෙසැම්බර්

**දායකත්වය**

*පර්යේෂණ සහාය:* සුනෙත් ගජනායක
සමුදු බස්නායක

*සංස්කරණය:* අජිත් පැරකුම් ජයසිංහ

*වීඩියෝ ප්‍රලේඛනය:* කේ. සංජීව

*ව්‍යාපෘති සම්බන්ධීකරණය:* ප්‍රසංග ප්‍රනාන්දු

*ව්‍යාපෘති කළමනාකරණය:* රශ්මිකා විජේසිංහ

*අධීක්ෂණය:* පිලිප් දිසානායක

*ප්‍රකාශනය:* රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

*මුද්‍රණය:* adARTS - මහරගම

# පටුන


| | |
|---|---|
| පෙරවදන | 5 |
| සාරාංශය | 7 |
| අධ්‍යයන ක්‍රමවේදය | 9 |
| මැයි 9 පළිගැනීමේ ප්‍රහාර සඳහා පසුබිම | 11 |
| මැයි 9 ගෝඨාගෝගම ප්‍රහාරයෙන් පසු | 13 |
| ඝාතන | 15 |
| වධහිංසනය | 19 |
| දේපල හානි | 21 |
| ප්‍රචණ්ඩත්වය, නීතිය හා ජනමාධ්‍ය | 30 |
| හානිපූරණය | 31 |
| අධ්‍යයනයේ නිර්දේශ | 32 |

# පෙරවදන

2022 වසර ආරම්භයේ සිට ශ්‍රී ලංකාව මුහුණදෙමින් සිටින්නේ පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකටය. එම අර්බුදය විසින් විශාල දේශපාලන අර්බුදයක් රට තුළ නිර්මාණය කරමින් 69 ලක්ෂයකට අධික ජනවරමක් සහිතව බලයට පත්වූ විධායක ජනාධිපතිවරයාටත්, අගමැතිවරයාටත් ඉල්ලා අස්වීමට සිදු විය.

#GotaGoHome තේමාව යටතේ ආරම්භ වූ මේ විරෝධතා ව්‍යාපාරය තුළ ක්‍රම වෙනසක් රටට අවශ්‍ය බවත්, ඊට තරුණ නියෝජනත්වයක් ලබා දිය යුතු බවටත් හඬක් නැගුණි. රට පුරා ගොඩනැගුණු මෙම සාමකාමී මහජන නැගීටීම මෙතෙක් රට තුළ නිර්මාණය වූ මහජන නැගිටීම්වලින් සම්පූර්ණ වෙනස් මුහුණුවරක් ගනු ලැබූවාය. සියලුම පංතීන්ට අයත් ලංකාවේ ජීවත් වන සෑම ජන කොටස් සහභාගී වූ මෙම නාගරිකයන්ගේ අරගලය දේදුනු අරගලය ලෙස නම් විය.

නමුත්, 2022 මැයි 09 වන දින මෙම සාමකාමී උද්ඝෝෂණයට එල්ල වූ කෲර මැර ප්‍රහාරයත් සමග එතෙක් පැවති තත්ත්වය සම්පූර්ණයෙන් උඩු යටිකුරු වී ජීවිත හානි මෙන්ම, දේපල හානි විශාල ප්‍රමාණයක් රටේ විවිධ ප්‍රදේශයන්ගෙන් වාර්තා විය. ඒ හේතුවෙන් පැනනැගුණු මහජන නැගිටීමෙහි සුවිශේෂ ලක්ෂණ රැසක් තිබේ. ඒවා හඳුනාගෙන සත්‍යය මධ්‍යස්ථව ලේඛනගත කළ යුතුව තිබේ.

රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය විසින් මෙම අධ්‍යයන මාලාව සිදුකරනු ලබන්නේ 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ සිදුවූ මහජන නැගිටීම ආශ්‍රය කරගෙන සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයන්, ප්‍රචණ්ඩත්වය හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ ගැටලු අධ්‍යයනය කිරීමේ, වාර්තාගත කිරීමේ හා සිදු නොවිය යුතු දේ හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණෙනි.

එහි දී අපි ප්‍රධාන සිද්ධි අධ්‍යයන තුනක් කෙරෙහි අවධානය යොමුකරන්නෙමු. ඒවා නම්, 2022 අප්‍රේල් 19 දින රඹුක්කන දී සිදුවූ පොලිස් වෙඩිතැබීම හා සම්බන්ධ සිදුවීම්, 2022 මැයි 9 දින ගාලුමුවදොර ජනාධිපති ලේකම් කාර්යාලය අසල විරෝධතා ස්ථානයට එල්ලකරන ලද ප්‍රහාරය සහ එයට පළිගැනීම් වශයෙන් එදිනම ආරම්භ වූ සෙසු සිදුවීම්ය.

රාජ්‍ය ප්‍රතිපත්ති තීරණ සඳහා මහජන සහභාගීත්වය තහවුරු කරන ආකාරය, එවැනි ප්‍රතිපත්ති තීරණ ධනාත්මක ලෙස විචාරයට ලක්කරන ආකාරය, වෙනස්කම් වෙනුවෙන් උද්දේශනය කරන ආකාරය, විරෝධය දැක්වීමේ නිදහස හා ප්‍රකාශනයේ නිදහස, සංවිධානය වීමේ අයිතිය, සාමකාමී විරෝධතාවන්හි දී අනුගමනය කළ යුතු මූලධර්ම, විරෝධතා සහ නීතිය, පොලිස් බලය භාවිත කිරීම සම්බන්ධ ගැටලු, ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර ගැටුම් වළක්වාගැනීම, සාමකාමී සංවාදය, මානව හිමිකම් උල්ලංඝනය හා ප්‍රචණ්ඩත්වය වළක්වාගැනීම කෙරෙහි අවධානය යොමුකිරීමට අපි උත්සාහ කරන්නෙමු.

**පිලිප් දිසානායක**
විධායක අධ්‍යක්ෂ, රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය

# සාරාංශය

2022 වසර ආරම්භ වන විට ශ්‍රී ලංකාවේ නිර්මාණය වී තිබූ පෙර නොවූ විරූ ආර්ථික හා දේශපාලන අර්බුදය පිළිබඳ මින් පෙර අප විසින් සම්පාදනය කරන ලද 'ගෝඨාගෝගම ප්‍රහාරය' නම් වාර්තාවේ සවිස්තරව දක්වන ලදි. ශ්‍රී ලංකාවේ අපනයන ආදායම් බිඳවැටී ආනයන වියදම් වැඩිවීමත් සමග නිර්මාණය වූ ජංගම ගිනුමේ හිඟය සහ රජයේ ආදායම් හා වියදම් අතර දැවැන්ත පරතරය හේතුවෙන් නිර්මාණය වූ රාජ්‍ය මූල්‍ය හිඟයේ ප්‍රතිඵලයක් ලෙස රටේ අර්බුද රැසක් නිර්මාණය විය.

රසායනික පොහොර සහ පලිබෝධ නාශක ආනයනය තහනම් කරමින් 2021 අප්‍රේල් 27 දා රජය නිකුත් කළ ගැසට් නිවේදනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ගොවි අරගල තීව්‍ර විය. ගොවි උද්ඝෝෂණ හා මහජන විරෝධය හේතුවෙන් මෙම තහනම නොවැම්බර් මාසයේදී ඉවත් කරන ලද නමුත් එමගින් වී ගොවිතැන ඇතුළු කෘෂි නිෂ්පාදනවලට දැවැන්ත බලපෑමක් ඇති විය.

2021 වසර මැද භාගයේදී, දීර්ඝ කාලයක් තිස්සේ පැවති වැටුප් විෂමතා විසඳන ලෙස ඉල්ලා දීප ව්‍යාප්ත ගුරු උද්ඝෝෂණයක් ඇතිවූ අතර සටන්කාමී වෘත්තීය අරගලයකින් පසුව 2022 වසර මුලදී රජය විසින් ගුරු වැටුප් විෂමතා ප්‍රශ්නයට විසඳුම් ලබාදෙන චක්‍රලේඛ නිකුත් කරන ලදි.

ගෘහස්ථ ගෑස් ටැංකි පිපිරීම 2021 අවසාන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ සිදු වූ තවත් බරපතල ගැටලුවකි. ගෑස් අනතුරු හේතුවෙන් මරණ 7ක් හා බරපතල අනතුරු සිදුවූ අතර ලිට්රෝ ගෑස් සමාගම අනතුරට ලක්වූ පාරිභෝගික ජනතාවට වන්දි ගෙව්වේ නැත.

2021 වසර ආරම්භ වන විට විපක්ෂය හා ආර්ථික විද්‍යාඥයන් රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් ලබාගෙන ණය ප්‍රතිව්‍යුහගත කරගත යුතු බවට අදහස් ඉදිරිපත් කළ මුත්, මුදල් අමාත්‍යාංශය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යාම සම්බන්ධයෙන් අදහස් දෙකක් පැවති හෙයින් තීරණයක් ගැනීම පමා විය.

කෙසේ වෙතත්, අප්‍රේල් මුල් සතියේ අගමැතිවරයා හැර මුදල් ඇමති ඇතුළු කැබිනට් මණ්ඩලය හා මහ බැංකුවේ අධිපතිවරයා ඉල්ලා අස්වූ අතර, අප්‍රේල් 12දා ශ්‍රී ලංකාව විදේශ ණය සේවා තාවකාලිකව අත්හිටුවන බව නිවේදනය කළේය.

2022 මාර්තු 31වෙනිදා ජනාධිපති  ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මිරිහානේ පිහිටි පෞද්ගලික නිවස ඉදිරිපිට මහජන උද්ඝෝෂණයක්  ආරම්භ කරන ලද අතර එහිදී ඇති වූ නොසන්සුන්තාවය හේතුවෙන් ආරක්ෂක අංශ විසින් කඳුළු ගෑස්, ජල ප්‍රහාරක රථ යෙදවීමටත්, එයට සහභාගී වූ පිරිස් අත්අඩංගුවට ගැනීමටත් ක්‍රියාකරන ලදි. ඒ සමගම රජයට එල්ලව තිබූ ප්‍රතිරෝධය තීව්‍ර විය. අප්‍රේල් මස 9වනදා, ජනපති ගෝඨාභය රාජපක්ෂ තනතුරෙන් ඉවත් විය යුතුය යන සටන් පාඨය පෙරදැරි කරගනිමින් විරෝධතාකරුවන් කණ්ඩායමක් ජනාධිපති ලේකම් කාර්යාලය අසල අඛණ්ඩ විරෝධතාවක් ආරම්භ කළහ. ජනාධිපති ලේකම් කාර්යාලය අසල 'ගෝඨාගෝගම' නම් ස්ථාවර විරෝධතා භූමියක් ස්ථාපිත කරගන්නා ලදි. පසුව ඒ හා සමාන ලෙස අග්‍රාමාත්‍ය නිල නිවස වන අරලියගහ මන්දිරය ඉදිරිපිට 'මයිනාගෝගම' නමින් ද විරෝධතා ස්ථානයක් ස්ථාපිත කරන ලදි.

2022 මැයි 9දා 'ගෝඨාගෝගම' සහ 'මයිනාගෝගම' නම් විරෝධතා ස්ථානයට එවකට පාලක පක්ෂය වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සම්බන්ධ පිරිස් විසින් දැඩි ප්‍රහාරයක් එල්ල කරන ලදි. එම ප්‍රහාරය වැළැක්වීම සඳහා පොලීසිය නිසි පරිදි කටයුතු නොකිරීම පසුපස කුමන්ත්‍රණකාරී තත්වයක් නිරීක්ෂණය කළ හැකිය. එහිදී ඒ සම්බන්ධ බලධාරීන් වන නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ගේ, පොලිස්පතිවරයාගේ මෙන්ම ආරක්ෂක ලේකම්ගේ ද ක්‍රියාකලාපය ගැටලු සහගතය.

මෙම ප්‍රහාරය සාමකාමී උද්ඝෝෂණයකට එල්ලකරන ලද අයුක්ති සහගත, ම්ලේච්ඡ ප්‍රහාරයක් ලෙස ක්ෂණිකව මාධ්‍ය මගින් වාර්තා කරන ලදි. ඒ සම්බන්ධයෙන් පුළුල් සමාජ අනුකම්පාවක් නිර්මාණය වූ බව නිරීක්ෂණය කළ හැකිය. ඒ සමගම එම ප්‍රහාරයට සම්බන්ධ වූ පිරිස්වලට එරෙහිව පළිගැනීමේ ප්‍රහාර මාලාවක් ගෝල්ෆේස් විරෝධතා ස්ථානයේ සිටම ආරම්භ කරන ලදි. ඒ සඳහා කිසියම් පෙර සූදානමක් තිබුණේද, නැතිනම් එය ස්වයංසිද්ධව පැනනැගුණු මහජන ප්‍රචණ්ඩත්වයක්ද යන්න තවමත් විමර්ශන මගින් හෙළිදරව් වී නොමැත. කෙසේ වෙතත්, සමාජයේ බුබුළු නැගෙමින් තිබුණු පීඩනයක් පුපුරා යාම සඳහා එම සිද්ධිය ඉවහල් වූ බව නිරීක්ෂණය කළ හැකිය. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහජන නියෝජිතයන්ට හා ක්‍රියාකාරිකයන්ට එරෙහිව පළිගැනීමේ ප්‍රහාර මාලාවක් එල්ල වූ අතර, පසුව එය බල පෙරළියක් දක්වා දිග්ගැසුණි.

දිවයිනේ දකුණු ප්‍රදේශවල දිස්ත්‍රික් රැසක ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තා විය. අරලියගහ මන්දිරයේදී හිටපු අගමැති මහින්ද රාජපක්ෂගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමට සහභාගී වූ හෝ ගෝඨාගෝගම ප්‍රහාරයට සම්බන්ධ වූ හෝ අය ලෙස සැලකෙන පුද්ගලයන්ට එරෙහිව පහරදීම්, හිංසා කිරීම් සිදුවූ අතර, එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ ඔහුගේ ආරක්ෂක පොලිස් නිලධාරියා පහරදී ඝාතනය කරන ලදි. තවත් පිරිසක් තුවාල ලබා රෝහල්ගත කරන ලද අතර එම තුවාලකරුවන් අතරින් ඇතැමෙකුට ජාතික රෝහලේ සේවකයන් යයි සැක කළ හැකි අය විසින් පවා පහර දෙන අන්දම මාධ්‍යවලින් විකාශය කරන ලදි. ගෝඨාගෝගම ප්‍රහාරයට සම්බන්ධ හෝ අරලියගහ මන්දිරයේ රැස්වීමට සහභාගී වූ හෝ පුද්ගලයන් යයි සැකකරනු ලබන පුද්ගලයන්ට දිවයිනේ විවිධ ප්‍රදේශවලදී පහරදෙන ලද අතර ඔවුන් ගමන් කළ පොදු ප්‍රවාහන බස්රථ ඇතුළු වාහනවලට පහරදී හානි සිදු කර ඇතැම් විට ගිනිතබා විනාශ කරන ලදි. ප්‍රධාන වශයෙන්ම පාලක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සම්බන්ධ පාර්ලිමේන්තු හා පළාත් පාලන මන්ත්‍රීවරුන් ඇතුළු පුද්ගලයන්ට අයත් නිවාස, කාර්යාල, ව්‍යාපාරික ස්ථාන ඇතුළු දේපල කඩා බිඳදමා, ගිනිතබා විනාශ කරන ලදි. ක්ෂණිකව, ඉතා කෙටි කාලයක් තුළ මෙම සිදුවීම් වාර්තා වූ අතර ඒ වන විට පැවති ඉන්ධන හිඟය හෝ ප්‍රවාහන දුෂ්කරතා ප්‍රහාරකයන්ට බාධාවක් වූ බව නොපෙනේ.

මෙම ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවූ මැයි 9, 10 දිනවලදී පොලිසිය එම ක්‍රියා වැළැක්වීමට ක්‍රියාත්මක වූයේ ඉතා අඩුවෙනි. හමුදාවට අවශ්‍ය නියෝග ලබාදී නොතිබුණු බව පෙනේ.

මෙම ප්‍රහාරවලට විශාල පිරිසක් අසංවිධානාත්මකව සම්බන්ධ වූ බව පෙනේ. ඇතැමෙකු මේවාට සම්බන්ධ වූයේ අන්තර්ජාලය හරහා සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට දිරිදීමෙනි.

ඒ සම්බන්ධයෙන් විමර්ශන තවමත් සිදුකරන බව පොලිසිය පවසයි. අතිවිශාල සංඛ්‍යාවක් සැකකරුවන් නීතිය හමුවට පමුණුවා තිබේ.

# අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේදී යොදාගනු ලැබූ ක්‍රමවේදය වූයේ සිද්ධියේ පාර්ශ්වකාර පුද්ගල සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් එක්රැස් කරගන්නා ලද තොරතුරු, මාධ්‍ය වාර්තා, අධිකරණ වාර්තා, තොරතුරු දැනගැනීමේ හිමිකම් පනත යටතේ ඉල්ලීම් ඉදිරිපත් කර ලබාගන්නා ලද තොරතුරු සහ පොලිස් හා වෙනත් අංශවල වාර්තා ඒකරාශී කර ඒවා සමස්ත පුළුල් වාර්තාවක් තුළ සංස්ලේෂණය කර ඉන් අනතුරුව විශ්ලේෂණය කිරීමයි. එහිදී, මෙම ව්‍යාපෘතියේම කොටසක් ලෙස තෝරාගත් සිදුවීම් 20ක් සම්බන්ධයෙන් කෙටි වීඩියෝ වාර්තා වැඩසටහන් නිර්මාණය කරන ලදි[1].

මැයි 9 දින උදෑසන ගාලු මුවදොර ජනාධිපති ලේකම් කාර්යාලය අසල උද්ඝෝෂණ ස්ථානයට එල්ලවූ ප්‍රහාරය පිළිබඳ විශ්ලේෂණයක් මීට පෙර සපයන ලදි[2]. මෙම අධ්‍යයනය ඒ සමග සමබන්ධය. මෙම අධ්‍යයනයෙහිදී අප අවධානය යොමුකරන්නේ ඉන්පසු ඇති වූ පළිගැනීමේ ප්‍රහාර මාලාව සමග සම්බන්ධ ප්‍රචණ්ඩත්වය කෙරෙහිය. එම සිදුවීම් හා සම්බන්ධ පසුබිම, ප්‍රහාර සිදුවූ ආකාරය, මානව හිමිකම් උල්ලංඝනයන් සහ හිංසනය, පොලිසිය හා ආරක්ෂක අංශ ආරක්ෂාව සැපයීමට අසමත් වීම, ප්‍රහාරවලින් සිදුවූ හානි, නීතිය ක්‍රියාත්මක වීම, වින්දිතයන්ගේ හා පවුල්වල අයිතිවාසිකම්, හානිපූරණය ආදී කරුණු කෙරෙහි අවධානය යොමුකිරීම මෙම අධ්‍යයනයෙහි අරමුණයි.

අධ්‍යයනය සිදුකිරීමේදී අප මුහුණදුන් ප්‍රධාන ගැටලුව වන්නේ තොරතුරු දත් ඇතැම් පාර්ශ්ව තමන්ට මර්දනයක් එල්ල වනු ඇතැයි බිය නිසා විස්තර ලබාදීමට ඉදිරිපත් නොවීමයි. ප්‍රහාරකයන්ගේ පාර්ශ්වයෙන් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ඉදිරිපත් වීමක් සිදුවූයේ නැති තරම්ය. ඒ වෙනුවට, ප්‍රහාර සම්බන්ධයෙන් බාහිර නිරීක්ෂණ සහ අධිකරණ වාර්තා මත රඳාපැවතීමට අපට සිදුවිය.

ප්‍රහාර අවස්ථාවේදී ඇතැම් පුද්ගලයන් විසින් ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය ඔස්සේ පළකර තිබූ අන්තර්ගතයන් එම වෙබ් වේදිකාව විසින් ඔවුන්ගේ ප්‍රජා ප්‍රමිතිවලට අනුකූල නොමැති නිසා ඉවත් කර තිබූ අතර, බොහෝ අය තමන් විසින්ම ඒවා මකාදමා තිබිණි. එහෙයින් ඇතැම් වටිනා සාක්ෂි විනාශ වීමක් සිදුවී තිබිණි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත හරහා පොලීසියෙන් ලබාගන්නා ලද නිල තොරතුරු හා ප්‍රමාණවත් තත්වයක පැවතියේ නැත.

සාමාන්‍යයෙන් සිදුවන අන්දමින් අධිකරණ නඩු විභාගයන් ප්‍රමාද වෙමින් ඇති බැවින් මෙම වාර්තාව සම්පාදනය කරන විටදී පවා ප්‍රහාර සම්බන්ධ කිසිදු නඩුවක් සම්බන්ධයෙන් අවසන් නිගමනයකට එළැඹී නොතිබිණි.

මෙම අධ්‍යයනයේදී පදනම් භාෂාව ලෙස භාවිතා කරනු ලැබුවේ සිංහල භාෂාවයි. මූලික වාර්තාව සිංහල බසින් සම්පාදනය කර පසුව ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කර තිබේ.

1. බලන්න www.Aithiya.lk and https://www.youtube.com/@aithiyamedia2463
2. https://www.right2lifelanka.org/publications/

# මැයි 9 පළිගැනීමේ ප්‍රහාර සඳහා පසුබිම

රසායනික පොහොර සහ පලිබෝධනාශක ඇතුළු කෘෂි රසායනික ආනයනය තහනම් කරමින් 2021 අප්‍රේල් 27 දා රජය නිකුත් කළ ගැසට් නිවේදනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ගොවි අරගල තීව්‍ර විය. ගොවි උද්ඝෝෂණ හා මහජන විරෝධය හේතුවෙන් මෙම තහනම නොවැම්බර් මාසයේදී ඉවත් කරන ලදමුත් එමගින් වී ගොවිතැන ඇතුළු කෘෂි නිෂ්පාදනවලට දැවැන්ත බලපෑමක් ඇති විය. ආහාර මිළ ඉහළ ගිය අතර අත්‍යවශ්‍ය ආහාර ආනයනය සඳහා ඩොලර් හිඟවීම ජන ජීවිතවලට බලපාන්නට පටන්ගත්තේය. මේ අතර සීනි, පොල්තෙල් ආදී භාණ්ඩ සඳහා බදු ඉවත් කිරීම පසුපස වංචා, දූෂණ පැවති බවට රජයට චෝදනා එල්ල විය. භාණ්ඩ මිල ඉහළ යාම අඛණ්ඩව සිදුවිය.

2021 වසර මැද භාගයේදී, කොවිඩ් අධිවසංගතය හේතුවෙන් පාසල් වසා තිබියදී, ගුරු සංගම් විසින් ජූලි 12දා සිට ගුරුවරුන් අන්තර්ජාලය හරහා ඉගැන්වීම් කිරීම වර්ජනය කිරීමට තීරණය කරන ලදි. දීර්ඝ කාලයක් තිස්සේ පැවති වැටුප් විෂමතා විසඳන ලෙස ඉල්ලා දීප ව්‍යාප්ත ගුරු උද්ඝෝෂණයක් ඇතිවූ අතර 2021 ඔක්තෝබර් 21දා සිට පාසල් නැවත විවෘත කිරීමට රජය තීරණය කරන විට ද වැටුප් ප්‍රශ්නය අවසන් වී නොතිබිණි. 2022 වසර මුලදී රජය විසින් ගුරු වැටුප් විෂමතා ප්‍රශ්නයට විසඳුම් ලබාදෙන චක්‍රලේඛ නිකුත් කරන ලදි.

ගෘහස්ථ ගෑස් ටැංකි පිපිරීම 2021 අවසාන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ සිදු වූ තවත් බරපතල ගැටලුවකි. මේ පිළිබඳ මව්බිම පුවත්පතට වාර්තාවක් සපයන උදේනි සමන් කුමාර මෙසේ වාර්තා කළේය: ''ගෑස් අනතුරු හේතුවෙන් මරණ 7ක්, බරපතළ තුවාල සිදුවීම් 16ක්, දේපළ හානි 18ක් සිදුව තිබිණි. ගෑස් අනතුරු වාර්තා වීම 2019 අවුරුද්දේ 78කි. 2020 අවුරුද්දේ 31කි. 2021 අවුරුද්දේ 847කි. එය තවදුරටත් පැහැදිලි කරන්නේ නම් 2021දී ලිට්රෝ ගෑස් සමාගම වෙළෙඳපොළට නිකුත් කළ ගෑස් සිලින්ඩර ලක්ෂ 28කින් 797ක් අනතුරට ලක්විය. ලිට්රෝ ගෑස් සමාගම අනතුරට ලක්වූ පාරිභෝගික ජනතාවට වන්දි ගෙව්වේ නැත.[3]''

2020 වසරේදී කොරෝනා අධිවසංගතයේ බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 3.5% කින් පහත වැටුණමුත්, 2021 වසරේදී 3.3%කින් වර්ධනය විය[4]. ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම නිසා ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොලවල් වෙත ප්‍රවේශය අහිමි විය. ශ්‍රී ලංකාව නිල සංචිත භාවිතා කරමින් සිය බාහිර ණය ගෙවීම සිදුකළ අතර බැංකු අංශයෙන් ලබාගත් ණය භාවිතා කරමින් ආනයන සඳහා ගෙවීම දිගටම කරගෙන ගියේය. නිල සංචිත 2019දී ඩොලර් බිලියන 7.6 සිට 2022 ජූනි මාසයේදී ඩොලර් මිලියන 400 දක්වා අඩු විය. විදේශ විනිමය ද්‍රවශීලතා සීමාව හේතුවෙන් 2022 දෙවන කාර්තුවේ සිට, ඉන්ධන, ඖෂධ, ගෑස් සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය යෙදවුම්වල දැඩි හිඟයක් නිර්මාණය විය. විදුලි කප්පාදුව පැය ගණන් දක්වා දීර්ඝ විය. අප්‍රේල් මුල් සතියේ මහබැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් සහ මුදල් ඇමති බැසිල් රාජපක්ෂ ධුරයෙන් ඉල්ලා අස්විය. නව මුදල් ඇමති ලෙස අලි සබ්‍රි හා මහ බැංකු අධිපති ලෙස නන්දලාල් වීරසිංහ පත්කරන ලදි.

2022 අප්‍රේල් 12දා බාහිර ණය සේවා අත්හිටුවන බව මහ බැංකු අධිපතිවරයා ප්‍රකාශයට පත් කළ අතර, පසුව, ණය ප්‍රතිව්‍යුහගත කිරීමට සහාය වීම සඳහා නීතිමය සහ මූල්‍ය උපදේශකයන් පත් කරන ලදි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබාගැනීම සඳහා සාකච්ඡා ආරම්භ කරන ලදි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය අනුව 2022 වසරේ මුල සිට උද්ධමනය වේගයෙන් වර්ධනය වූ අතර සැප්තැම්බර් මාසයේ 64.1%ක් විය[5].

2022 ජූලි මාසයේදී නව ජනාධිපතිවරයෙකු පත් කරන ලදි. කෙසේ වෙතත්, ආර්ථික අර්බුදය දිගට ඇදෙමින් ඇති අතර දේශපාලන ආතතීන් ද ඉහළ මට්ටමක පවතී. 2022 වසර අවසානය වන විට

3. මව්බිම පුවත්පත, 2022 ජූනි 18
4. National Output, Expenditure and Income, 2022, Central Bank of Sri Lanka
5. https://www.cbsl.gov.lk/en/measures-of-consumer-price-inflation

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය 9.2%කින් හා 2023 වසරේදී තවත් 4.2%කින් පහත වැටෙනු ඇතැයි ලෝක බැංකුව විසින් පුරෝකථනය කර තිබේ[6].

ආර්ථික හා දේශපාලනික අර්බුදය හේතුවෙන් 2022 දෙවන කාර්තුවේදී මින් පෙර සිදු නොවූ ආකාරයේ මහජන නැගිටීමක් සිදුවිය. මෙම මහජන නැගිටීම උතුරු නැගෙනහිර පළාත් හැර දිවයිනේ අනෙකුත් ප්‍රධාන නගරවලට ද ව්‍යාප්ත වූ අතර විවිධ මහජන ක්‍රියාකාරකම් රැසක් එහිදී සිදුවිය.

නොසන්සුන් වූ පුරවැසියන් තැන තැන උද්ඝෝෂණ කරමින් සිටි අතර 2022 මාර්තු 31වෙනිදා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මිරිහානේ පිහිටි පෞද්ගලික නිවස ඉදිරිපිට මහජන උද්ඝෝෂණයක් ආරම්භ කළහ. එහිදී ඇති වූ නොසන්සුන්තාවය හේතුවෙන් උද්ඝෝෂණ මර්දනය කිරීමට ආරක්ෂක අංශ විසින් කඳුළු ගෑස්, ජල ප්‍රහාරක රථ යෙදවීමටත්, එයට සහභාගී වූ පිරිස් අත්අඩංගුවට ගැනීමටත් ක්‍රියාකරන ලදි. එම සිදුවීමත් සමගම ජනාධිපති  ගෝඨාභය රාජපක්ෂ  ඇතුළු රජයට එල්ලව තිබූ ප්‍රතිරෝධය තීව්‍ර විය. එහි දිගුවක් ලෙස අප්‍රේල් මස 9වනදා, ජනපති ගෝඨාභය රාජපක්ෂ තනතුරෙන් ඉවත් විය යුතුය සහ පවතින ක්‍රමය වෙනස් කළ යුතුය යන සටන් පාඨ ඉදිරිපත් කරමින් විරෝධතාකරුවන් කණ්ඩායමක් ජනාධිපති ලේකම් කාර්යාලය අසල ගාලුමුවදොර පිටියේ වාඩිලාගෙන අඛණ්ඩ විරෝධතාවක් ආරම්භ කළහ. එම භූමියේ කූඩාරම්, අට්ටාල සකසාගත් අරගලකරුවන් එම ස්ථානය ‘ගෝඨාගෝගම’ ලෙස නම් කළහ. එදා සිට ගෝඨාගෝගම අරගල භූමිය අගෝස්තු 10 දක්වා ක්‍රියාත්මක විය. පසුව, මේ හා සමාන විරෝධතා ස්ථාන අග්‍රාමාත්‍ය නිල නිවස ඉදිරිපිටත්, මහනුවර, ගාල්ල, කුරුණෑගල, අනුරාධපුර ආදී නගර කේන්ද්‍ර කරගෙනත් විරෝධතාකරුවන් විසින් ස්ථාපිත කරන ලදි. අගමැති නිල නිවස ඉදිරිපිට ආරම්භ කරන ලද විරෝධතා ස්ථානය හඳුන්වනු ලැබුවේ ‘මයිනාගෝගම’ ලෙසයි. #GotaGoHome හෑෂ්ටැගය අරගලයේ මුල් කාලයේදී අතිවිශාල වශයෙන් සමාජ මාධ්‍ය හරහා ප්‍රවර්ධනය කරන ලදි.

විශේෂයෙන්ම මධ්‍යම පන්තික ජන කොටස් අතරින් පැනනැගුණු සාමකාමී විරෝධතා පසුව තරමක් ආක්‍රමණශීලී ස්වභාවයකින් යුක්ත වුව ද, මූලික වශයෙන් සාමකාමී විය. විරෝධතාකරුවන් විසින් පොදු ස්ථාන අත්පත් කරගෙන අඛණ්ඩව විරෝධතා දියත් කරන ලදි. ගෝල්ෆේස්හි ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන පිවිසුම් දොරටුව විරෝධතාකරුවන් විසින් ආවරණය කර එය ප්‍රධානම විරෝධතා ස්ථානය බවට පත්කරන ලදි.

ඒ කාලවකවානුවේදී දහස් ගණනින් පිරිස් මේ අරගලය සමග එකතු වූ අතර විවිධ අවස්ථාවන්වල මර්දනකාරී සිදුවීම්, මානවහිමිකම් උල්ලංඝනය වීම්, පහරදීම්, වධ හිංසාවට ලක්කිරීම් ඇතුලු සිදුවීම් රාශියක් වාර්තාවිය.

අප්‍රේල් 19දා කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කනදී ඉන්ධන නොලැබීම සම්බන්ධයෙන් උද්ඝෝෂණය කරමින් සිටි ජනයා සහ පොලිසිය අතර ඇති වූ ගැටමුකදී පොලිස් වෙඩිතැබීම් හේතුවෙන් මරණයක් වාර්තා විය. තවත් සිවිල් වැසියන් 13 දෙනෙකු සහ පොලිස් නිලධාරීන් 20දෙනෙකු තුවාල ලද බව පොලීසිය සඳහන් කළේය[7].

ඒ අතරින්, මැයි 9දා සිදුවූ සිදුවීම් දේශපාලනික වශයෙන් අතිශය වැදගත් වන අතර, එම සිදුවීම් කොටස් දෙකකට වර්ගීකරණය කළ හැකිය. ඒ අතරින්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සම්බන්ධ පාර්ශ්ව විසින් මැයි 9 දින මුලින් ගාලුමුවදොර ජනාධිපති ලේකම් කාර්යාලය අසල උද්ඝෝෂණ ස්ථානයට එල්ල කරන ලද ප්‍රහාරය පිළිබඳ වාර්තාවක් මීට පෙර සම්පාදනය කරන ලදි[8]. මෙම වාර්තාවෙහි අරමුණ එම සිදුවීම්වලින් පසුව ඒ හා සම්බන්ධව සිදුවූ මානව හිමිකම් උල්ලංඝනයන්, ප්‍රචණ්ඩත්වය හා ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධ ගැටලු අධ්‍යයනය කර වාර්තා කිරීමයි.

6. Sri Lanka Development Update, October-2022, World Bank
7. https://www.bbc.com/sinhala/sri-lanka-61150034
8. https://www.right2lifelanka.org/publications/

## මැයි 9 ගෝඨාගෝගම ප්‍රහාරයෙන් පසු

මැයි 9 දින අග්‍රාමාත්‍ය නිල නිවස වන අරලියගහ මන්දිරයට රැස්වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ක්‍රියාකාරිකයන් පිරිසක් ඉන් අනතුරුව අග්‍රාමාත්‍ය නිල නිවස අසල පැවති 'මයිනාගෝගම' හා ගාලු මුවදොර ජනාධිපති ලේකම් කාර්යාලය අසල පැවති 'ගෝඨාගෝගම' නම් විරෝධතා ස්ථාන දෙකට දරුණු ප්‍රහාරයක් එල්ල කළහ. එම ප්‍රහාර හේතුවෙන් සැලකිය යුතු පිරිසක් තුවාල ලැබූ අතර විරෝධතා ස්ථානවල කූඩාරම්, ප්‍රචාරක උපකරණ හා එහි සිටි පුද්ගලයන්ගේ පෞද්ගලික උපකරණ ආදිය විනාශ කරන ලදි. මෙම සිදුවීම් රූපවාහිනී හා සමාජ මාධ්‍ය ඔස්සේ සජීවීව විකාශය කරන ලදි. ඒ සමගම ගාලු මුවදොර ආසන්නයේ සිට පළිගැනීමේ ප්‍රහාර ලෙස හැඳින්විය හැකි ක්‍රියාවලිය ආරම්භ වූ අතර ඉන්පසු ඒවා රට පුරා බොහෝ ප්‍රදේශ වෙත වේගයෙන් ව්‍යාප්ත විය. මැයි 9, 10 දින හා ඒ ආසන්න දිනවල සිදුවූ පළිගැනීමේ ප්‍රහාරවල විශේෂ ලක්ෂණ කීපයක් මෙසේ හඳුනාගත හැකිය.

- ප්‍රධාන ධාරාවේ ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය විසින් ගෝඨාගෝගමට එල්ල වූ ප්‍රහාරය අධි සංවේදී ලෙස වාර්තාකරණය
- මහජන වෛරය අවුළුවාලන අන්දමේ මාධ්‍ය හා සමාජ මාධ්‍ය ප්‍රචාර හා සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රහාර එල්ල කළ යුතු ස්ථාන, යායුතු මාර්ග හා ප්‍රහාර පිළිබඳ තොරතුරු බෙදාගැනීම
- අගමැති නිල නිවස වන අරලියගහ මන්දිරයේ රැස්වීමට සහභාගී වූ හා ඉන්පසු අගමැති නිල නිවස ඉදිරිපිට හා ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණ ස්ථානවලට පහරදීමට සම්බන්ධ වූ ඇතැම් පිරිස් එම ස්ථානය ආසන්නයේදීම පහරදීමට හා හිංසනයට ලක්වීම
- එම ප්‍රහාරවලට සම්බන්ධ යයි සැකකරන වෙනත් පිරිස් ද හිංසනයට ලක්වීම
- අරලියගහ මන්දිරයේ පැවති රැස්වීමට පිරිස් ප්‍රවාහනය කළ බවට සැක කරන ලද බස්රථ ඇතුළු වාහනවලට පහරදී, පෙරළා, ගිනිතබා අලාභ හානි කිරීම
- ප්‍රහාරවලට සම්බන්ධ, රැස්වීමට සහභාගී වූ මෙන්ම එසේ නොකළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන් හා පළාත් පාලන සභිකයන් ඇතුළු පිරිස් ප්‍රහාරයට ලක්වීම. ඔවුන්ගේ නිවාස, කාර්යාල, වාහන හා වෙනත් දේපළ විනාශ කිරීම.
- එක්සත් ජාතික පක්ෂය සහ සමගි ජන බලවේගය වැනි වෙනත් ඇතැම් දේශපාලන පක්ෂවල අය ද ප්‍රහාරයට ලක්වීම
- ප්‍රහාර ක්ෂණිකව, කෙටි කාලයක් තුළ සිදුවීම හා ඒ වන විට පැවති ඉන්ධන හිඟය හා ප්‍රවාහන ගැටලු ආදිය ප්‍රහාරකයන්ට බාධාවක් නොවීම
- ප්‍රහාර පසුබිමේ සංවිධානාත්මක පිරිස් සිටි බවට චෝදනා එල්ලවීම හා ඇතැමුන් 'අරගලයට' සම්බන්ධ දේශපාලන පක්ෂවලට චෝදනා එල්ල කිරීම[9] සහ එම පක්ෂ එකී චෝදනා ප්‍රතික්ෂේප කිරීම
- ප්‍රහාරවලට සම්බන්ධ වූ ඇතැම් පිරිස් මත්පැන්, මත්ද්‍රව්‍ය, සොරකම් ආදිය සම්බන්ධයෙන් චෝදනා ලබන පුද්ගලයන් වීම
- මිනීමැරුම්, හිංසනය, දේපළ විනාශ කිරීම් ආදිය වැළැක්වීම සඳහා පොලිසිය හා ආරක්ෂක හමුදා ක්‍රියාත්මක නොවීම
- විමර්ශනවල මන්දගාමීත්වය, වැරදිකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීමේ අකාර්යක්ෂමතාව හා සත්‍යය හෙළිදරව් නොවීම

9. 2022 ජුලි 9 සිළුමිණ පුවත්පත

## ඝාතන

| | නම | තත්ත්වය | මිය ගිය ස්ථානය | මිය ගිය ආකාරය |
|---|---|---|---|---|
| 01 | අමරකීර්ති අතුකෝරළ (57) | පාර්ලිමේන්තු මන්ත්‍රී - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | නිට්ටඹුව නගරය | බරපතල පහරදීම |
| 02 | ජයන්ත ගුණවර්ධන (51) | පොලිස් නිලධාරී, පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරළ මහතාගෙ පෞද්ගලික් ආරක්ෂක නිලධාරී | නිට්ටඹුව නගරය | බරපතල පහරදීම සහ වෙඩි ප්‍රහාර |
| 03 | හර්ෂ නදීෂාන් ජයවීර (27) | මීරිගම කල්එළියේ පදිංචි කුඩා ව්‍යාපාරිකයෙක් | නිට්ටඹුව නගරය | වෙඩි ප්‍රහාර |
| 04 | ඩී.වී.සරත් කුමාර | ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභාපති | ඉමදූව | ඔහුගේ නිවසට ප්‍රහාරයක් එල්ලකරන අවස්ථාවේදී හෘදයාබාධයක් හේතුවෙන් |
| 05 | එම්.එන්.මොහොමඩ් නසීර් (32) | වීරකැටිය යක්ගස්මුල්ලේ පදිංචිකරුවෙක් | වීරකැටිය | වීරකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන දිසානායකගේ නිවස අසල සිදු වූ වෙඩි තැබීමකින් |
| 06 | ආර්.ජී.සුගත් ජානක | වලස්මුල්ල, රජයේ පාසලක චිත්‍ර ගුරුවරයෙක් | වීරකැටිය | වීරකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන දිසානායකගේ නිවස අසල සිදු වූ වෙඩි තැබීමකින් |
| 07 | ප්‍රියන්ත කුමාර (21) | මිනුවන්ගොඩ පදිංචිකරුවෙක් | මීගමුව | මීගමුව ඇවන්රා ගාඩ්න් හෝටලය අසල සිදුවූ වෙඩි තැබීමකින් |
| 08 | ශෙහාන් උදයංග (19) | මීගමුවේ පදිංචිකරුවෙක් | මීගමුව | මීගමුව ඇවන්රා ගාඩ්න් හෝටලය අසල සිදුවූ වෙඩි තැබීමකින් |

### පොළොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරළ සහ ඔහුගේ ආරක්ෂක නිලධාරීවරයා නිට්ටඹුවේ දී ඝාතනය කිරීම

මැයි මස 9 වෙනදා අරලියගහ මන්දිරයේ පැවතුණු රැස්වීමට සහභාගී වීම සඳහා පොළොන්නරුවේ සිට පාර්ලිමේන්තු මන්ත්‍රී අමරකීර්ති අතුකෝරළ මහතා සමඟ ඔහුගේ රියදුරු සහ පෞද්ගලික ආරක්ෂක නිලධාරී ඇතුළු හත්දෙනෙක් ඔහුගේ නිල ජීප් රථයෙන් කොළඹ බලා පිටත්වී ඇත.

ඔවුන්රැස්වීමට සම්බන්ධ වී මධ්‍යාහ්නයේදී පිටතට පැමිණ, කොළඹ පිහිටි සිරිපාල ගම්ලත් අමාත්‍යවරයාගේ නිවසින් දිවා ආහරය ගෙන ප.ව 2.30ට පමණ පොළොන්නරුව බලා යාමට පිටත්ව ඇත. පිරිස ගමන්ගත් රථය නිට්ටඹුව නගරයේදී එදින ප්‍රචණ්ඩ ලෙස හැසිරුණ පිරිස්වලට කොටුවූ අතරමන්ත්‍රීවරයා ඇතුළු පිරිස පවසා තිබුණේ විවාහ මංගල උත්සවයකට සහභාගිවී ආපසු යන බවයි.

එච්. අයි. ජී සමන් කුමාර මහතා අමරකීර්ති අතුකෝරළ මහතාගේ රියදුරු ලෙස රාජකාරිය ආරම්භ කර ඇත්තේ 2012 වර්ෂයේ පටන්ය. ඔහු පොළොන්නරුව නව නගරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මැයි 9 දා

ප.ව 3.00-3.30 අතර කාලය තුළදී විරෝධතාකරුවන්ගේ බාධා හේතුවෙන් අමරකීර්ති අතුකෝරළ ඇතුළු පිරිස ගමන් ගත් රථය මාර්ගයේ පසෙකට කර නවත්වන්නට රියදුරු හට සිදු විය. එසේ රථය නවත්වා තිබූ අතරවාරයේ එක් විරෝධතාකරුවෙකු විසින් අමරකීර්ති අතුකෝරළ මහතාගේ ආරක්ෂක පොලිස් සැරයන් ගුණවර්ධන මහතාව රථයෙන් බස්සවා ඔහුට පොල්ලකින් ප්‍රහාර එල්ල කර ඇත. ඉන් අනතුරුව තවත් විරෝධතාකරුවෙකු පැමිණ රථයේ ඉදිරිපස අසුනේ සිටි අමරකීර්ති අතුකෝරළ මහතාව ද එයින් බස්සවාගෙන පසෙකට රැගෙන ගොස් ප්‍රශ්න කරමින් සිටි අතර විරෝධතාකරුවෙකු පැමිණ පොලු පහර කිහිපයක් එල්ල කර ඇත. මේ අවස්ථාව වන විටදී මෝටර් රථයේ පැමිණි අනෙකුත් පිරිස ඇති වී තිබූ නොසන්සුන්තාවය හමුවේ රථයෙන් ඉවතට බැස විසිරී ගොස් ඇත.




සමන් කුමාර මහතා පවසන පරිදි ඔහුට වෙඩි තැබීමේ ශබ්දය තුන්වතාවක් ඇසුණු පසු රැස්ව සිටි විරෝධතාකරුවන් තරමක් විසිරී යන ආකාරයක් පෙනීගොස් ඇත. ඒ මොහොත වන විට අමරකීර්ති අතුකෝරළ මහතා සහ ඔහුගේ ආරක්ෂක පොලිස් සැරයන් ගුණවර්ධන මහතා පදික වේදිකාව ඔස්සේ දිවගොස් නිට්ටඹුව නගරයේ ඇති නිහාල් ෆැෂන් රෙදිපිළි වෙළෙඳසැල තුළට පිවිසි බව සමන් කුමාර මහතාගේ ප්‍රකාශයේ සඳහන් වෙයි. ඉන් අනතුරුව ඔහුද ඒ අසලම පිහිටි මාර්ගයක් වෙත දිව ගොස් සැඟව සිටි අතරතුර විරෝධතාකරුවන් කිහිපදෙනෙකු පැමිණ ඔහුට නැවත පහරදී ඇත. එම ප්‍රහාරයන් හමුවේ ඔහුගේ හිසේ තුවාල ඇති බව දුටු එක් පුද්ගලයෙකු සමන් කුමාර මහතාව එතැනින් රැගෙන ගොස් ඇත. ඔහු මැයි 9 දා රැය පහන් කර ඇත්තේ නිට්ටඹුව බස් ඩිපෝවේය. ඉන් පසුදා එනම් මැයි 10 වන දින සමන් කුමාර මහතාව නිට්ටඹුව පොලීසිය වෙත භාර දී ඇත්තේ ඔහුව තව දුරටත් පහරකෑමෙන් ගලවාගත් ඉහත කී පුද්ගලයා විසින් බව ඔහු පවසයි. ඒ වන විටත් ඔහු දරුණු ප්‍රහාරයකට ලක්ව සිට ඇති අතර ඔහුගේ අනන්‍යතාව තහවුරු කිරීමට තිබූ ජාතික හැඳුනුම්පත, රියදුරු බලපත්‍රය සහ ඔහුගේ බිරිඳගේ ATM කාඩ්පත ඇතුළත් මුදල් පසුම්බිය විරෝධතාකරුවන් විසින් බලහත්කාරයෙන් ලබාගෙන ඇත.

අමරකීර්ති අතුකෝරළ සහ ඔහුගේ ආරක්ෂක පොලිස් සැරයන්වරයා නිට්ටඹුව නගරයේදී ප්‍රචණ්ඩ පිරිස්වලට මැදි වීමෙන් අනතුරුව ආරක්ෂාව උදෙසා එම නගරයේ පිහිටි නිහාල් ෆැෂන් රෙදි වෙළෙඳ සැලට ගොස් සැඟවී සිටින අතර ආරක්ෂක අංශ සහ පොලීසිය දැනුවත් කර ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට විනාඩි තිහක පමණ කාලයක් පුරාවට උත්සාහ කළ නමුත් අදාළ අංශ මඟින් වගකීම් විරහිත ලෙස ප්‍රතිචාර නොදැක්වීම තම පියාගේ ඝාතනය සිදුවන්නට හේතු වූ බව මන්ත්‍රීවරයාගේ පුත්‍රයා වන රනිඳු අතුකෝරළ විශ්වාස කරයි.

මන්ත්‍රීවරයාගේ ආරක්ෂකයා විසින් වෙඩි ප්‍රහාරයක් එල්ල කිරීමත් සමඟ මරණයක් සිදුවී තත්ත්වය උත්සන්න වී ඇත. ඉන්පසු ඔවුන්ගේ ආරක්ෂාව සලසා ගැනීම උදෙසා නිට්ටඹුව නිහාල් ෆැෂන් රෙදි වෙළෙඳසැලට පිවිසි අතර එහි සිට ආරක්ෂක අංශ සම්බන්ධ කරගැනීමට මන්ත්‍රීවරයා කිහිප වතාවක්ම උත්සාහ කර ඇත. සිරිපාල ගම්ලත් අමාත්‍යවරයා ද අමරකීර්ති අතුකෝරළ මන්ත්‍රීවරයාගේ පෞද්ගලික ලේකම් නිශාන්ත විතානගේ මහතා ද මන්ත්‍රීවරයාගේ ආරක්ෂාව තහවුරු කිරීම පිණිස අදාළ අංශ දුරකථනයෙන් සම්බන්ධ කරගනිමින් අවශ්‍ය දැනුම්දීම් කර තිබෙනමුත් එම පාර්ශවයන් ක්‍රියාත්මක නොවූ බව ඔවුහු පවසති.

ප්‍රචණ්ඩකාරී පිරිස මන්ත්‍රීවරයාගේ ආරක්ෂක පොලිස් සැරයන්වරයාගෙන් පිස්තෝලය උදුරාගෙන ඔවුන්ට පහරදී හිස පහතට සිටින සේ පඩි පෙළ දිගේ පහළට ඇදගෙන එන ආකාරය දැක්වෙන වීඩියෝ සමාජ මාධ්‍යවල සංසරණය විය.

## හර්ෂ නදීෂාන් ජයවීර ඝාතනය




මැයි 9දා නිට්ටඹුව නගරයේදී සිදු වූ වෙඩි තැබීමෙන් මීරිගම, කල්එළිය ප්‍රදේශයේ පදිංචි හර්ෂ නදීශාන් ජයවීර නැමති 27 හැවිරිදි විවාහක තරුණයා ජීවිතක්ෂයට පත්ව ඇත. ඒ සිදුවීම පිළිබඳව මියගිය තරුණයාගේ මව පවසන්නේ ඔහු පසුගිය කාලය පුරාවට පැවති කිසිදු විරෝධතාවකට සහය නොදුන් බවයි.ඔහු එදින නිට්ටඹුව නගරයට ගොස් ඇත්තේ තමන්ගේ යතුරුපැදියට අවශ්‍ය අමතර කොටස් කිහිපයක් මිලදී ගැනීමේ අරමුණින් බවත් ය. හර්ෂ යතුරු පැදි මිලට ගෙන ඒවා අලුත්වැඩියා කර විකිණීමේ ව්‍යාපාරයක නිරත වී සිටි අයෙකි.

මෙකී ඝාතන සිදුවීම් පිළිබඳව නිට්ටඹුව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ. පී. ඩී. අබේරත්නගේ මෙහෙයවීමෙන් පරීක්ෂණ ඇරැඹී අතර, පසුදා, එනම් මැයි 10දා අලුයම අත්තනගල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර ඇත.

අත්තනගල්ල අංක 02 මහේස්ත්‍රාත්වරිය මළසිරුරු තිබූ ස්ථානයට ගොස් නිරීක්ෂණ කටයුතු සිදුකොට වතුපිටිවල මූලික රෝහලට ගොස් එහිදී මියගොස් සිටි මීරිගම තරුණයාගේ සිරුර ද පරීක්ෂා කර බලා තිදෙනා ගැනම පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම සඳහා නියෝග කළාය.

අනතුරුව වතුපිටිවල මූලික රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී රමේෂ් අලගියවන්න සිදුකළ පශ්චාත් මරණ පරීක්ෂණයෙන් නිගමනය කර ඇත්තේ අමරකීර්ති අතුකෝරාළ මන්ත්‍රීවරයා මියගොස් ඇත්තේ අධික ලෙස පහර දීමෙන් ඔහුගේ සිරුරේ අස්ථි බිඳී යාමෙන් වූ අභ්‍යන්තර රුධිර වහනය නිසාවෙන් බවයි. මන්ත්‍රීවරයාගේ සිරුරේ බහුවිධ තුවාල තිබූ බව ද වාර්තාවේ දැක්වේ.

මන්ත්‍රීවරයා සමඟම මියගොස් සිටි ආරක්ෂක නිලධාරී පොලිස් සැරයන් ජයන්ත ගුණවර්ධනගේ මළසිරුර පිළිබඳ සිදුකළ පශ්චාත් මරණ පරීක්ෂණයේදී ද හෙළි වී තිබුණේ සැරයන්වරයා මියගොස් ඇත්තේ පපු ප්‍රදේශයට එල්ල කළ වෙඩි ප්‍රහාරයකින් එම වෙඩි උණ්ඩය ඔහුගේ පෙනහැල්ල හරහා ගමන් කරමින් සිරුර පසාරු කර පිටව යාම නිසාත් ඔහුට පහරදීමෙන් හිස්කබල පුපුරා යාමෙන් මොළයට රුධිරය වහනය වීම නිසාත් බවයි. එසේම පොලිස් සැරයන්වරයාගේ සිරුරේ ද බහුවිධ තුවාල රැසක්ම ඇති බවත් එම වෛද්‍ය වාර්තාවේ සඳහන් වේ.

වැඩිදුර විමර්ශනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන මනුෂ්‍ය ඝාතන සහ සංවිධානාත්මක අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කෙරෙන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මහතා පැවසීය.

මැයි 26 දින වන විට මෙම සිදුවීමට සම්බන්ධව සැකකරුවන් 14 දෙනකු අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන්ගෙන් දෙදෙනෙක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් බවට සිදුකළ විමර්ශනවලින් සොයාගෙන ඇත. පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මහතා සඳහන් කළේ, සැකකරුවන් දෙදෙනා අභාවප්‍රාප්ත මන්ත්‍රීවරයාගේ රියදුරු විදුලි පහන් කණුවක ගැටගසා පහරදී ඇති බවයි. පසුව ඔවුන් රියදුරුගෙන් සොරාගත් ATM කාඩ්පත භාවිතා කර රු. 250,000ට ආසන්න භාණ්ඩ ලබා ගෙන ඇත. මෙම මිලදී ගත් භාණ්ඩවලින් කිහිපයක් සැකකරුවන් අලෙවි කර ඇත්තේ මත්කුඩු මිලදී ගැනීමට මුදල් සොයාගැනීමට බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා වැඩිදුරටත් පැවසීය[10].

10. දෙරණ පුවත් https://www.youtube.com/watch?v=32wGajky470

පා.ම අමරකීර්ති අතුකෝරළ මහතාගේ ඝාතනයෙන් පසු ඔහු පැළඳ සිටි රන් භාණ්ඩ ගලවා ගෙන ගිය බව කියන සැකකරුවන් දෙදෙනකු ඇතුළුව අගෝස්තු 11දා වන විට සැකකරුවෝ 37දෙනෙකු ඝාතනය සම්බන්ධයෙන් රිමාන්ඩ් භාරයේ රඳවා සිටියහ.මන්ත්‍රී ආරක්ෂක සැරයන්වරයාගෙන් පැහැරගෙන තිබුණු පිස්තෝලය ද සොයා ගැනීමට රහස් පොලිස් නිලධාරීන්ට හැකිවී තිබේ.

මෙමඝාතන සම්බන්ධ විමර්ශන හා අධිකරණ ක්‍රියාවලි සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරු අදහස් ඉදිරිපත් කළහ.

''අත්තනගල්ල උසාවිය තුළ මේ නඩුකරය සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව යම් ආකාරයක සැකයක් තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරතුමාගෙන් මේ සම්බන්ධව ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වෙනවා,'' යි ප්‍රේම්නාත් සී දොලවත්තමන්ත්‍රීවරයා (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ) පැවසීය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මෙසේ පැවසීය: ''මම මන්ත්‍රීවරයකු ලෙසත්, වෘත්තීය නීතිඥවරයෙකු ලෙසත් මැයි 22දා අත්තනගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයට ගිය අවස්ථාවේ අවාසනාවන්ත තත්ත්වයක් මම දැක්කා. උගත් මහෙස්ත්‍රාත්වරයෙක් මනුෂ්‍ය ඝාතන ගැන පොලිස් විමර්ශනවලට සහාය දීම අත්‍යවශ්‍ය කාරණාවක්. අත්තනගල්ල මහෙස්ත්‍රාත්තුමිය විවෘත අධිකරණයේදී විමර්ශනය කරන පොලිස් නිලධාරීන්ව දැඩි අපහසුතාවට පත් කරන ආකාරයට හැසිරුණා.''

නිට්ටඹුවේ සිදුවූ ඝාතනවලට අමතරව වීරකැටිය, මීගමුව සහ ඉමදූව ප්‍රදේශයන්හිදී ද ජීවිත හානි සිදු වී ඇත. ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභාපති ඒ.වී.සරත් කුමාර ඔහුගේ නිවසට ප්‍රහාරයක් එල්ලකරන අවස්ථාවේදී හෘදයාබාධයක් හේතුවෙන් රෝහල් ගත කරන විටත් මියගොස් ඇත[11]. තවද වීරකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන දිසානායකගේ නිවස අසල සිදු වූ වෙඩි තැබීමකින් වීරකැටිය යක්ග ස්මුල්ලේ පදිංචි 32 හැවිරිදි එම්.එන්.මොහොමඩ් නසීර් හා වලස්මුල්ල, රජයේ පාසලක චිත්‍ර ගුරුවරයකු බව සඳහන් වන වීරකැටිය හකුරුවෙල පදිංචි ආර්.ජී.සුගත් ජානක නැමති දෙදෙනා මිය ගොස් ඇත[12]. දෙදෙනාම තිදරු පියවරු වෙති.

මීගමුවේ Avenra Gardens හෝටලය අසලදී එල්ල වූ ප්‍රහාරයකින් ද දෙදෙනෙකු මරුමුවට පත් වූහ. ඒ අනුව මැයි 9 වනදා සිදු වී ඇති ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් හේතුවෙන් ජීවිතක්ෂයට පත් වූ මුළු සංඛ්‍යාව 08කි.

11. https://si.rata.lk/25851/
12. සිළුමිණ පුවත්පත

# වධහිංසනය

## සමගි ජන බලවේගය (විපක්ෂ) පාර්ලිමේන්තු මන්ත්‍රී කුමාර වෙල්ගම මහතාට එල්ල වූ ප්‍රහාරය

මැයි 09 වනදා උද‍ෑසන කොළඹ පැවති සාකච්ඡාවකට සහාභාගී වූ කලුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කුමාර වෙල්ගම මහතා තම රියදුරාත්, පෞද්ගලික ශරීර ආරක්ෂක නිලධාරීවරයාත් සමග රාත්‍රී 8.00ට පමණ තම නිවස පිහිටි මතුගම ප්‍රදේශය බලා යාමට දක්ෂිණ අධිවේගී මාර්ගයට පිවිසීම සඳහා කොට්ටාව, මාකුඹුර අධිවේගී පිවිසුම බලා ගමන් කර ඇත. ඒ යන අතරතුරදී මාකුඹුර හන්දියට පැමිණි විටදී එම ස්ථානයේ තුන් හාරසීයක් පමණ පිරිසක් රැස්ව සිට ඇත. එහිදී මෝටර්සයිකලයක් පැමිණ වාහනය හරස්කොට නවත්වා ඉන් පසු රියදුරුට පහරදී වාහනයෙන් බස්සවාගෙන ඇති අතර වාහනයට පොලු මුගුරුවලින් පහර දී විදුරු කුඩු කර දැඩි ලෙස අලාභහානි කොට ඇත. ඒ වන විට වෙල්ගම මහතා අසුන් ගෙන සිටියේ වම් පස ඉදිරි ආසනයේ වන අතර ඔහුගේ පෞද්ගලික ශරීර ආරක්ෂක පැමිණ රථයේ දොර ඇර වෙල්ගම මහතාට පහර නොදෙන ලෙස කියමින් වැළඳගෙන තිබේ. ඔහු එළියට ඇදගත් අවස්ථාවේම වෙල්ගම මහතා සිටි පසු පස දොර වැසී අගුලු වැටී නැවත ඇරීමට නොහැකි වී තිබේ. නමුත් රියදුරුගේ පසෙහි දොර ඇරී තිබූ අතර එයින් පොලු මුගුරු දමා වෙල්ගම මහතාට දැඩි ලෙස පහර එල්ල කර ඇත. එම පහරදීම් හේතුවෙන් ලේ වහනය වන තරමේ දැඩි තුවාල ලැබූ වෙල්ගම මහතා වාහනය තුළම ඉතා අසීරුවෙන් සිට ඇත.

සුළු මොහොතකින් වාහනයට ගිනිතැබූ බව කෙනෙකු වෙල්ගම මහතාට පවසා ඇති අතර ඔහු ඒ අවස්ථාවේ තමා රථයෙන් එළියට ගන්නා මෙන් ඉල්ලා ඇත. එක් තරුණයෙකු යකඩ පොල්ලක් දමා වාහනයේ දොර කඩා වෙල්ගම මහතාව එළියට ගෙන පදික වේදිකාව වෙත ගෙනගොස් ඇත.

වෙල්ගම මහතා පවසන පරිදි ඒ වන විටත් ඔහු පැමිණි මෝටර් රථය ගිනි ගනිමින් තිබූ අතර ඔහු ඇඳ සිටි ඇඳුම් සියල්ල ගැලවී ගොස් යට ඇඳුම් පමණක් ඉතිරිව තිබිණි. ඔහුව බේරාගත් තරුණයාට ද එතන සිටි පිරිස පහර දී ඇති අතර පසුව ඔහු වෙල්ගම මහතාව පදික වේදිකාව ඔස්සේ ඇදගෙන ගොස් ත්‍රිරෝදරියක දමාගෙන හෝමාගම රෝහල වෙත ගෙනගොස් ඇත[13].

ගෝඨාගෝගමට පහරදුන් බවට චෝදනා එල්ලවූ කොළඹ හිටපු නාගරික මන්ත්‍රීවරයකු සහ පදික වෙළඳුන්ගේ වෘත්තීය සමිති නායකයකු වන වන මහින්ද කහඳගමගේට සහ ඔහුගේ නිවසට ප්‍රහාරයක් එල්ල විය. මහින්ද කහඳගමගේ අල්ලා ගෙන ඇඳුම් ඉරාදමා පහරදීමෙන් පසු ඔහු අවට සිටි අයගෙන් 'අනේ මාව ඉස්පිරිතාලෙට අරන් යන්න' යි කරන ඉල්ලීම සමාජ මාධ්‍යවල ප්‍රසිද්ධ විහිළුවක් බවට පත්කරගන්නා ලදි[14],

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සම්බන්ධ ගුරු සංගමයක නායිකාවක් වන වසන්තා හඳපාන්ගොඩ පිරිමින් හා කාන්තාවන් පිරිසක් විසින් වධහිංසනයට ලක්කරන ආකාරය දැක්වෙන වීඩියෝ[15] ද 'හඳපානේ, හඳපානේ' නම් ප්‍රසිද්ධ ගීතය සමග යොදාගෙන හාස්‍යයට ලක්කරන වීඩියෝ ද සමාජ මාධ්‍යවලට සංසරණය විය.

ගෝඨාගෝගම ප්‍රහාරයට සම්බන්ධ යයි සැකකරන ලද පිරිසකට පහරදී ගාලු මුවදොර ආසන්නයේ අපිරිසිදු ජලය සහිත බේරේ වැවට බස්සවා වධහිංසනයට ලක්කරන ලදි[16]. එම වීඩියෝ ද 'බැස සීතල වතුරේ පීන පීන නාමුකෝ සුදෝ' නම් ප්‍රසිද්ධ ගීතය සමග සංස්කරණය කර සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කරනු දක්නට ලැබිණි.

13. https://youtu.be/FskQPLde2Xc
14. https://www.youtube.com/watch?v=KiVmaIVv2GU
15. https://www.youtube.com/watch?v=h5Twkrr82X0
16. https://www.youtube.com/shorts/9B_8j-jnTug

පළිගැනීමේ ප්‍රහාරවලින් තුවාල ලද පිරිස් ජාතික රෝහල වෙත ගෙන යන ලද අවස්ථාවේදී රෝහලේ සුළු සේවකයන් යයි සිතිය හැකි පිරිස් පවා රෝගීන්ට ට්‍රොලි මතදීම පහරදෙන ආකාරය දැක්වෙන වීඩියෝ ප්‍රවෘත්තිවල විකාශය විය[17]. එහිදී වෛද්‍යවරුන් පිරිසක් රෝගීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් නිර්භයව ඉදිරියට පැමිණෙනු දක්නට ලැබිණි. ජාතික රෝහල අසලදී පොලිසිය හා හමුදාව ද හිංසනයට ලක්වනු දක්නට ලැබිණි[18].

පොලිසියට එරෙහි ශාරීරික හිංසනයන් සිදුවූයේ ඉතා අඩුවෙනි. එහෙත්, මෙම සමස්ත ක්‍රියාවලිය පුරාම පොලිසියට, හමුදාවන්ට එරෙහි වාචික හිංසනය විරෝධතාකරුවන් විසින් සුලභව භාවිතා කරන ලදි.

17. https://www.youtube.com/watch?v=Xr62VUrLf5w
18. https://www.youtube.com/watch?v=ju973Q0fj2s

# දේපල හානි

වාහනවලට පහරදීම්, දේපළ විනාශ කිරීම් හා ගිනිතැබීම් ආරම්භ වූයේ මැයි 9 දා සවස්වරුවේ සිට ය. මුලින් කොළඹ නාගරික බල ප්‍රදේශයට පමණක් පැනවුණු පොලිස් ඇඳිරි නීතිය එදින පස්වරුව වන විට මුළු රට පුරා පනවනු ලැබූ මුත්, ප්‍රචණ්ඩත්වය පැතිරීම පාලනය කිරීම සඳහා පොලිසිය ක්‍රියාශීලීව කටයුතු නොකිරීම හේතුවෙන් ඇඳිරි නීති මධ්‍යයේම ප්‍රචණ්ඩ පිරිස් විනාශකාරී ක්‍රියාවල නිරත වූහ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මැති ඇමැතිවරුන් 58කගේ හා පළාත් පාලන ආයතන සභාපතිවරුන් හා සභිකයන් 75කගේ පමණ නිවාසවලට සහ කාර්යාලවලට කඩාවැදී ඒවාට හා වාහන ආදියට පහරදෙමින් ගිනිතබමින් අතිවිශාල විනාශයක් සිදුකරන ලදි.

## මහජන නියෝජිතයන්ගේ දේපලවලට එල්ල වූ ප්‍රහාරයන්

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන මැති ඇමතිවරුන් වන චමල් රාජපක්ෂ, රෝහිත අබේගුණවර්ධන, රමේෂ් පතිරණ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, ප්‍රසන්න රණතුංග, බන්දුල ගුණවර්ධන, කෙහෙළිය රඹුක්වැල්ල, ගාමිණී ලොකුගේ, විමල් වීරවංශ, බැසිල් රාජපක්ෂ, පවිත්‍රා වන්නිආරච්චි, ශෙහාන් සේමසිංහ, කංචන විජේසේකර, නසීර් අහමඩ්, දිනේෂ් ගුණවර්ධන, විදුර වික්‍රමනායක, නාලක ගොඩහේවා, ජනක බණ්ඩාර තෙන්නකෝන්, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, එස්.එම්. චන්ද්‍රසේන, චන්න ජයසුමන, කනක හේරත්, හිටපු නියෝජ්‍ය කථානායක රංජිත් සියඹලාපිටිය, හිටපු රාජ්‍ය අමාත්‍යවරුන් වන අරුන්දික ප්‍රනාන්දු, මොහාන් සිල්වා, ශෂීන්ද්‍ර රාජපක්ෂ, සනත් නිශාන්ත, ශාන්ත බණ්ඩාර, ගුණපාල රත්නසේකර, සිරිපාල ගම්ලත්, ඩී.වී. හේරත්, නිමල් ලන්සා, දුමින්ද දිසානායක, ගීතා කුමරසිංහ, අශෝක ප්‍රියන්ත, රෝහණ දිසානායක, මිලාන් ජයතිලක, කෝකිලා හර්ෂණී ගුණවර්ධන, උද්දික ප්‍රේමරත්න, අලි සබ්‍රි රහීම්, සම්පත් අතුකෝරල, සනත් ප්‍රදීප් විතාරණ, ඩබ්ලිව්.ඩී. වීරසිංහ, සමන්ප්‍රිය හේරත්, අනුප පැස්කුවල්, රජිත වික්‍රමසිංහ, ජගත් කුමාර, තිස්ස කුට්ටිආරච්චි, චන්දිම වීරක්කොඩි, ජයන්ත කැටගොඩ, ප්‍රේමනාත් දොලවත්ත, නිපුන රණවක, සංජීව එදිරිමාන්න සහ ලලිත් වර්ණකුමාර ඇතුළු මැති ඇමැතිවරුන්ගේ නිවාස යාන වාහන දේපළ රැසකට පහරදී ගිනිතබා විනාශ කරන ලදි.



මැයි 9 උදෑසන අරලියගහ මන්දිරයේ පැවති රැස්වීමේ ප්‍රධාන භූමිකාවක් ඉටු කළ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ කුරුණෑගල නිවසට රථ වාහනවලට සහ මැතිවරණ කාර්යාලයට පහරදී කඩා බිඳ දමා ගිනිතබා තිබුණු අතර, ඔහුගේ සමීපතමයකු බව කියන කුරුණෑගල නගරාධිපති තුෂාර සංජීවගේ නිවසට ද ගිනිතබා විනාශ කර අලාභ හානි සිදුකර තිබිණි. ජොන්ස්ටන් ප්‍රනාන්දුට අයත් ලග්ගල ප්‍රදේශයේ ගොවිපළක් ද විනාශ කර තිබුණේ එහි සතුන් කැලයට මුදාහැරීමෙන් අනතුරුවය. ජොන්ස්ටන් ප්‍රනාන්දුගේ තලංගම වැව පාරේ පිහිටි නිවසක් ද මුළුමනින්ම ගිනිබත්කර තිබුණේ 10 වැනිදා රාත්‍රියේය. ජොන්ස්ටන් ප්‍රනාන්දුට අයත් කුරුණෑගල පිහිටි කාර්යාල ව්‍යාපාරික ස්ථාන, බෝතල් ගබඩාවක් සහ මත්පැන් නිෂ්පාදනාගාරයකට ද ගිනිතබා තිබිණි.

ගෝඨාගෝගම ප්‍රහාරය සිදුවන අවස්ථාවේ ගාලුමුවදොර පිටියේ සිටි බවට සාක්ෂි තිබෙන පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සනත් නිශාන්තගේ නිවස සහ ඔහුගේ සොයුරු ජගත් සමන්තගේ නිවස ද ගිනිතබා බරපතළ හානි කරන ලදි.

හිටපු අමාත්‍ය ප්‍රසන්න රණතුංගගේ උඩුගම්පොල පිහිටි නිවසට ද දරුණු ප්‍රහාරයක් එල්ල වූ අතර පසුව එය ගිනිබත් කරන ලදි. එම නිවෙසේ ඉදිරිපිට ගාල්කර තිබුණු මෝටර් බයිසිකල් 25ක් පමණද ගිනිතබා විනාශ කර දමා තිබිණි. මෙම ඉඩමේ තිබුණු රණතුංග පවුලේ නිවසට 1977දී දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියාවලදි ද ගිනිතබන ලදි.

හිටපු ජනාධිපති සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්ට අයත් කුරුණෑගල නිවසක් ද ගිනිතබා විනාශ කරන ලදි.

පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්න සිය කාර්යාලය පවත්වාගෙන යන්නේ අනුරාධපුර මහනගර සභා නිල නිවාසවලට අයත් නිවසක වන අතර ඊට ද ගල්මුල් ප්‍රහාර එල්ල විය.

රිෂාඩ් බදියුදීන් මහතා නායකත්වය දරණ  සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අලි සබ්‍රි රහීම්ට මෙන්ම ඔහුගේ පුත්‍රයාට සහ දියණියට අයත් පුත්තලම වාන මාර්ග යේ පිහිටි නිවාස තුනකට ද ප්‍රහාර එල්ල විය.

එක්සත් ජාතික පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ලක්ෂ්මන් විජේමාන්න සහ විජේපාල හෙට්ටිආරච්චි, යාපනය දිස්ත්‍රික් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී අංගජන් රාමනාදන් වැනි අයගේ නිවාසවලට සහ කාර්යාලවලට ද ප්‍රහාර එල්ල විය.

හිටපු පළාත් සභා මන්ත්‍රී කපිල දිසානායකට අයත් මැදමුලන නිවසට ද ප්‍රහාර එල්ලවූ අතර හිටපු පළාත් සභා මන්ත්‍රී උපාලි කොඩිකාරගේ උඩහමුල්ලේ නිවසට ද එල්ල වූ ප්‍රහාරවලින් බරපතළ හානි සිදුවිය.

මොරටුව නගරාධිපති සමන් ලාල් ප්‍රනාන්දුගේ නිවස ද ගිනිතබා බරපතළ හානි කරන ලදි. ප්‍රචණ්ඩ පිරිස් මොරටුව නගර සභාව, නගරාධිපති කාර්යාලයට සහ එහි වාහන කිහිපයකට ද ගිනිතබා බරපතළ හානි සිදු කළහ.

දඹුල්ල නගරාධිපති ජාලිය ඕපාතගේ නිවස මෙන්ම ඔහුගේ මවගේ සහ සොයුරාගේ නිවාස ද ගිනිතබා විනාශ කර තිබිණි.

ගාල්ල නගරාධිපති ප්‍රියන්ත සහබන්දු, හොරණ නගරාධිපති විතාරමගේ සිරිසෝම, මිනුවන්ගොඩ නගරසභාවේ සභාපති නීල් ජයසේකර, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති කුමාර අරංගල්ල, වළල්ලාවිට ප්‍රාදේශීය සභාවේ සභාපති උදේනි අතුකෝරළ, බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභා සභාපති දිල්රුක් අබේකෝන්, ආනමඩුව ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රියන්ත, ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති කරුණාසේන පොන්නම්පෙරුම, කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපති ගාමිණී අමරවංශ, අම්බලන්ගො ඩ ප්‍රාදේශීය සභාවේ සභාපති පුෂ්පලාල් කුමාරසිංහ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සභාපති දේවේන්ද්‍ර පෙරේරා, ගම්පහ නගරාධිපති එරංග සේනානායක, පන්නල ප්‍රාදේශීය සභාවේ සභාපති රංජිත් ලංසක්කාර, කැස්බෑව නගරාධිපති ලක්ෂ්මන් පෙරේරා, කටාන ප්‍රාදේශීය සභාවේ සභාපති කුමාර අරංගල්ල  බිංගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපති දිමුත් තුෂාර ඒකනායක, බලංගොඩ ප්‍රාදේශීය සභාවේ සභාපති සුනිල් ප්‍රේමසිරි, පුත්තලම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපති නිමල් බමුණුආරච්චි, අනුරාධපුර නගරාධිපති එච්.පී. සෝමදාස, බද්දේගම නගර සභාවේ උප සභාපති අනුර නාරංගොඩ, දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ සභාපති සුජීව වෙදගේ, මීගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති ප්‍රසන්න රෝහණ, මීගමුව නගරාධිපති දයාන් ලන්සා, බියගම ප්‍රාදේශීය සභාවේ උපසභාපති අජිත් කුමාර, ගම්පහ ප්‍රාදේශීය සභාවේ උපසභාපති රංජිත් ගුණවර්ධන සහ විවිධ සභාවල මන්ත්‍රීවරුන් වැනි පළාත් පාලන නියෝජිතයන්ගේ නිවාසවලට ද පහරදී බරපතළ අලාභ හානි කර හෝ ගිනිතබා හෝ තිබූ අයුරු දක්නට ලැබිණි.

ගාලුමුවදොර අරගල භූමියේදී කාන්තාවකට පහර දුන් බව කියන සීතාවක සමුපකාර සමිතියේ සභාපතිගේ නිවසට ද ප්‍රහාරයක් එල්ල විය. අවිස්සාවේල්ල පොදුජන පෙරමුණු සංවිධායක නීතිඥ රවීන්ද්‍ර ජයසිංහගේ නිවසට ද ගිනිතබා අලාභ හානි සිදුකර තිබිණි. උතුරු මැද පළාත් හිටපු ප්‍රධාන අමාත්‍ය එස්.එම්. රංජිත්ගේ කාර්යාලය පවත්වාගෙන ගිය නිවසට ද ගල්මුල් ප්‍රහාරවලින් බරපතළ හානි සිදුවිය.

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන දිසානායකගේ මැදමුලන පිහිටි නිවසට පහරදීමට කිසියම් පිරිසක් පැමිණි අවස්ථාවේ සිදුවූ වෙඩි තැබීමකින් පුද්ගලයින් දෙදෙනෙකු ජීවිතක්ෂයට පත්විය. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිවස ද මුළුමනින්ම ගිනිබත් කරන ලදි.

ඉමදූව ප්‍රාදේශීය සභාවේ සභාපති ඒ.වී. සරත් කුමාරගේ නිවසට කිසියම් පිරිසක් ගල්මුල් ප්‍රහාර එල්ල කරද්දී රෝගී වූ අතර ගාල්ල කරාපිටිය රෝහලට ඇතුළු කිරීමෙන් පසු මිය ගියේය.

මහනුවර නගර මධ්‍යයේ පවත්වාගෙන ගිය විරෝධතා මධ්‍යස්ථානයට ප්‍රහාරයක් එල්ල කළ බව කියන නාගරික මන්ත්‍රීවරයෙකුගේ බෝගම්බර නිවසට ද ප්‍රහාරයකින් හානි සිදුවිය.

ගල්මුල් පහරට ලක්වූ පළාත් පාලන නියෝජිතයන් කීපදෙනෙක් රෝහල්ගත කරනු ලැබූහ.

වීරකැටිය ප්‍රාදේශීය සභාවේ සභාපති පියසේන ලියනාරච්චිගේ මැදමුලන නිවස ගිනිබත් කිරීමට පෙර ඒ අසලදී සිදුවූ වෙඩි තැබීමෙන් දෙදෙනෙකු තුවාල ලැබූහ.

රත්ගම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ නිවසට ද ප්‍රහාරයක් එල්ල වූ අතර එහිදී සිදුවූ වෙඩි තැබීමෙන් සිවු දෙනෙකු තුවාල ලබා රෝහල් ගතකරනු ලැබූහ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ලලිත් එල්ලාවලගේ නිවස කලහකාරින් ගෙන් බේරා ගැනීමට ප්‍රදේශවාසීන්ට හැකි විය. ඔහු එම පක්ෂයේ බණ්ඩාරගම සංවිධායකවරයාය.

මේ අතර, බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මහතා ගේ නිවසට ද මැයි 9 වනදා ප්‍රහාර එල්ල කර ඇත[19].

සමගි ජන  බලවේගයේ අක්මීමන ආසනයේ ප්‍රධාන සංවිධායක ලෙස කටයුතු කරන බී. එච් විජේපාල මහතාගේ පෝද්දල මීපාවල බද්දේගම පාරේ නිවසට මැයි 09 වනදා රාත්‍රී 9.15ට පමණ පිරිසක් විසින් ප්‍රහාරයක් එල්ල කර ඇත.

**මූලාශ්‍ර**

https://www.newsfirst.lk/2022/05/10/heres-a-list-of-slpp-politico-property-destroyed-so-far/

http://www.themorning.lk/slpp-releases-list-of-mps-properties-destroyed-in-mondays-violence/

https://youtu.be/XOchIm50sls

https://youtu.be/iayCm86ISkg

https://youtu.be/JXzC_3lAS-E

19. https://youtu.be/B9jJtehBjgo

## රාජපක්ෂවරුන්ට වූ හානිය












හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිදු වූ පහරදීම් හා ගිනිතැබීම් අතර රාජපක්ෂවරුන්ගේ නිවාස හා දේපළවලට කළ හානි රැසක්ද විය. ඒ අතරින් පසුගිය කාලය පුරාවටම රට තුළ මහත් ආන්දෝලනයක් ඇති කල මැදමුලන මංසංධියේ ස්ථාපිත කර තිබූ ඩී.ඒ.රාජපක්ෂ හා දන්දිනා සමරසිංහ දිසානායක ස්මාරක කඩා විනාශ කර දැමීම කාගේත් අවධානයට ලක්විය. 2014 දී විවෘත කරන ලද මෙම ස්මාරකය රුපියල් මිලියන 81.3 ක වියදමින් ඉදිකර ඇත. හිටපු මන්ත්‍රීවරයකු වන දිවංගත පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී.ඒ.රාජපක්ෂ හා ඔහුගේ බිරිඳ වන නැසීගිය දන්දිනා සමරසිංහ දිසානායක යනු මහින්ද රාජපක්ෂ හා ගෝඨාභය රාජපක්ෂගේත්, දේශපාලනයේ සිටින බැසිල් හා චමල් රාජපක්ෂ ඇතුළු සොයුරු සොයුරියන්ගේ මව සහ පියාය.

තංගල්ල නගරයේ පිහිටි ඩී.ඒ. රාජපක්ෂ පිළිරුව ද පෙරළා විනාශ කරන ලදි.

හිටපු අගමැති මහින්ද රාජපක්ෂ මහතා භාවිත කළ වීරකැටිය කාල්ටන් වත්තේ නිවසකට ද ගල්මුල් ප්‍රහාර එල්ල වූ අතර එම ප්‍රහාරයට පැමිණි පිරිස ගෙමිදුලේ නවතා තිබුණු වාහනයකට ද ගිනිතැබූහ.

චමල් රාජපක්ෂ මහතාගේ බිරිදගේ සහෝදරයෙකු වන දකුණු පළාත් සභා මන්ත්‍රී කපිල දිසානායකට අයත් මැදමුලන මංසන්ධියේ පිහිටි නිවසට ප්‍රහාරයක් එල්ල වන්නේ ඉන් අනතුරුවය. තෙමහල් නිවස ගිනිතබා විනාශ කරන ලදි.




අනතුරුව විරෝධතාකරුවන් වීරකැටිය කාල්ටන් වත්තේ පිහිටි හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා භාවිතා කළ නිවසටද ගල් මුල් ප්‍රහාරයක් එල්ල කර ගෙවත්තේ නවතා තිබූ වාහනයකටද ගිනිතබා විනාශ කළහ.

හිටපු අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාට අයත් දේපළ රැසකටද හානි සිදුකිරීමට කටයුතු කරන ලදි. තිස්සමහාරාම පොලිස් වසමේ තිස්සමහාරාම, දෙබරවැව, සේනපුර ලිපිනයේ පිහිටි හිටපු අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ නිවසට හා කාර්යාලයට ද, කිරින්ද පොලිස් වසමේ මාගම, කිරින්ද ලිපිනයේ පිහිටි තවත් නිවසකට ද ගිනිතබා අලාභහානි සිදුකරන ලදි. එම නිවෙස්වල තිබුණු වී, පොහොර ආදිය සොරකම් කරන ලදි.

රාජපක්ෂ පවුලට සමීපව කටයුතු කළ ආධාර කරුවන්ට මෙන්ම ප්‍රාදේශීය නායකයන්ටද ප්‍රහාර පිට ප්‍රහාර එල්ල විය.පනහක පමණ පිරිසකින් සමන්විත තරුණයින් පිරිසක් 10 දින රාත්‍රී හතට පමණ තංගල්ල පොලිස් වසමේ බෙලිඅත්ත පාරේ පිහිටි කාල්ටන් නිවසට ද පහරදී ගිනිතබා ඇති අතර විශේෂ කාර්ය බලකා නිලධාරීන් මැදිහත්ව ගින්න නිවා දමා තිබේ. මැයි 10 දින උදෑසන තංගල්ල පොලිස් වසමේ මැදකැටිය පාර, මැඩිල්ල ප්‍රදේශයේ පිහිටි හිටපු අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතාට අයත් වැඩ අවසන් කර නොමැති මහල් තුනකින් සමන්විත හෝටලයට ද ගිනිතබා විනාශ කර තිබේ.

මීට අමතරව රත්නපුර දිස්ත්‍රික්කයේ සිංහරාජ රක්ෂිතයට මායිම්ව ගොන්ගල කන්ද පාමුල අක්කර විස්සකින් සමන්විත භූමිභාගයක ඉදිකර තිබූ යෝෂිත රාජපක්ෂට අයිති හෝටල් සංකීර්ණය මැයි 10දා ගිනිතබා විනාශ කර ඇත.



හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාට අයත් බව කියන මල්වානේ නිවසටද විරෝධතාකරුවන් විසින් පහරදී ගිනිතබා තිබේ.



**මූලාශ්‍ර**

2022 මැයි 14 සිළුමිණ පුවත්පත

https://youtu.be/FoADLOUhR6E

https://youtu.be/F0mqQ13tIZM

## පොදු ප්‍රවාහනයට සිදු වූ හානිය

මැයි 09 වනදා අරගලය ගහ මන්දිරයට සෙනග ප්‍රවාහනය කර ආපසු යන අවස්ථාවේ බස් රථවලට එල්ල වූ ප්‍රහාර හේතුවෙන් බස්රථ 50ක් පමණ විනාශ වූ බව ද, එයින් 38ක් මුළුමනින්ම විනාශ කරන ලද බව ද ලංකා පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමයේ සභාපති ගැමුණු විජේරත්න පෙන්වා දුන්නේය.



මේ සියලු බස් රථ ඕනෑම ආකාරයක පෞද්ගලික ගමන් සඳහා කුලී පදනම මත ලබා දෙන බවත් එය ඔවුන්ගේ ව්‍යාපාරයේ කොටසක් බවත්ඔහු පැවසීය. මේ ආකාරයෙන් අජීවී වස්තූන්ට හානි සිදු කිරීම කිසිසේත්ම ඵල රහිත ක්‍රියාවක් බව පෙන්වා දුන් ඔහු සම්බන්ධව යුරෝපා සංගමයටත්,එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවටත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවටත් පැමිණිලි යොමුකොට ඇති බවත් එම සියලු පැමිණිලි පිටපත් පොලිස්පතිවරයාට ලබා දී ඇති බවත් ප්‍රකාශ කලේය. මෙම ප්‍රහාරය නිසා එම විනාශයට ලක් වූ බස් රථ හිමියන් අන්ත අසරණ තත්වයට ඇද වැටී ඇති බව ද, එම බස් රථ රක්ෂණය කොට ඇත්තේ බස් රථය මිලදී ගන්නා අවස්ථාවේ පැවති මිල ගණන් වන ලක්ෂ 38-40 මුදලට බවත් අද වනවිට බස් රථයක් මිලියන 10 ආසන්න වන නිසා පූර්ණ රක්ෂණය ලැබුණත් ඔවුන්ට අලුත් බස්රථ මිලදී ගැනීම දුෂ්කර බව ද පෙන්වාදුන්නේය. එම ප්‍රහාරවලදී හුදු රැකියාවල නියුතු වූවන් වන බස් රථ රියදුරන් හා සහායකයන්ට ප්‍රහාර එල්ල වී තිබූ බවත්, ජීවිත හානි සිදුවී නොතිබුණත් දරුණු ලෙස වධහිංසනයට ලක්වූ තරුණ බස් රථ සහයකයන් සිටි බවත් ඔහු ප්‍රකාශ කළේය. එප්පාවල ප්‍රදේශය එවැනි බස් රථ සහායකවරයෙකුගේ පාදයේ අස්ථි කුඩු වන ආකාරයේ බරපතළ ප්‍රහාරයක් එල්ල කර තිබූ  බව ද ඔහු පැවසීය.



සිදු කරන ලද ප්‍රහාරය සම්බන්ධව ඕනෑ තරම් වීඩියෝ සාක්ෂි ඇති හෙයින් ඒ හරහා පොලිසියට වරදකරුවන් කොටු කර ගැනීමට හැකි වුව හොත් ඔවුන්ට විරුද්ධව සිවිල් නඩු මාර්ගයෙන් වන්දි ලබාගැනීමට කටයුතු කරන බවද ඔහු කියා සිටියේය.

**මූලාශ්‍ර**

https://youtu.be/cNzeJ35pcuA

## ව්‍යාපාරික ස්ථානවලට සිදු වූ හානිය

### මීගමුව ඇවෙන්රා ගාඩ්න්ස් හෝටලයට පහර දීම සහ පසුබිම[20]

දිවයින පුරා සිදුවූ ගිනිතැබීම් සහ කොල්ලකෑම්වලින් වැඩිම අලාභයක් සිදුවූයේ මීගමු සංචාරක පුරවරයේ පිහිටි තරුපන්තියේ හෝටලයක් වූ ඇවෙන්රා හෝටල් සමූහයටය. දහසකට ආසන්න පිරිසක් මැයි මස 9දා එම හෝටල් සමූහයට කඩාවැදී මුළු හෝටල් සංකීර්ණයම ගිනිබත් කළහ. ඊට පසුදා තවත් පිරිසක්

20. https://youtu.be/SKpifS82X3Q

එම හෝටල් සංකීර්ණයට ඇතුළු වී එහි තිබූ වටිනා බඩුබාහිරාදිය, රන්, මුදල්, ඩොලර් ආදී බොහෝ දේ කොල්ලකාගෙන පලා ගොස් ඇත. හෝටලය අවට ඇතැම් පිරිස් හෝටල් කාමරවල තිබූ ඇඳ ඇතිරිලි, පුටු, මේස ඇතුළු තවත් වටිනා දෑ වාහනවල පවා පටවාගෙන යන අයුරු විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කෙරිණි.



මීගමුව ඇවෙන්රා හෝටල් සංකීර්ණය ගිනිතැබීමෙන් නතර නොවූ ප්‍රචණ්ඩකාරීහු එම හෝටල් සමූහය අයත් ව්‍යාපාරිකයාගේ මීගමුවේ පිහිටි විශාලතම අවන්හලක් වන බේෆොන්ට් සංචාරක හෝටලයටත්, එහි හිමිකරු පන්සල පාරේ අලුතෙන් තනා තිබූ සුවිසල් නිවසකට ද ගිනිතබා විනාශ කළහ.



මීගමුව මහ හුණුපිටිය ප්‍රදේශයේ පිහිටි ඇවෙන්රා හෝටල් සමූහයේ හිමිකරු වන්නේ ධනවත් ව්‍යාපාරිකයකු වූ ධනේෂ් ද සිල්වා මහතාය.

“මම එදා මගේ දරුවන් එක්ක ගෙදර හිටියේ. නගරාධිපතිගේ ගෙදරට ගැහැව්වට පස්සෙ මට කෙනෙක් කතා කරලා කිව්වා අපට ගහන්නට එන නිසා පුළුවන් තරම් ඉක්මනට අයින් වෙන්න කියලා. මම ඒක එස්එස්පී මහත්තයට කිව්වා. එයා කිව්වා කට්ටිය නැහැ පුළුවන් තරමින් එවන්නම් කියලා.”

‘‘ඒත් එක්කම මම හෝටලේ තිබුණු වාහන පුළුවන් පුළුවන් ඒවා එළියට යැව්වා. අනිත් කට්ටිය ඔක්කොම එළියට යැව්වා. හමර් එකයි තවවාහනයකුයි ළමයි අරන් ගියාට පස්සේ ලැම්බෝගිනි එකකුයි, හමර් ජීප් එකකුයි හෝටලේ තිබුණා. මම ඒක අරගෙන ගිහින් හෝටලේ කාර්පාක් එකට දැම්මා. මම හිතුවේ නැහැ මෙච්චර දෙයක් වෙයි කියලා. මම ගෙදර ඉන්දැද්දී වැඩකරපු කට්ටිය කිව්වා, සර් යමු යමු මෙතැන ඉන්න එපා කියලා.

‘‘ඒ අය මුළු හෝටලයම කුඩු කළා. කුඩු කරපු නැති තැනක් නැහැ. වාහන 12ක්ගිනි තිබ්බා. එළියට අරන් ගිය හමර් එකකුයි තව වාහන කිහිපයකුත් මඟදි අල්ලලා ගිනි තියලා තිබුණා.





ඉන් පස්සේ තමයි මේ අය හෝටලේ මංකොල්ලකන්නේ. ඇඳගෙන ඉන්න ඇඳුම විතරයි ඉතුරු වුණේ.

''සේප්පු 4ක් කඩලා තිබුණා. අඩි 5ක විතර ලොකු සේප්පු තුනක් කඩලා තියෙනවා. මැනේජර්ගේ සේප්පුව බයිසිකලයක තියාගෙන අරන් යනකොට බයිසිකලේ ටයර් එක පුපුරලා ඉන් පස්සේ ඒක බඩි ලොරියක පටවාගෙන අරගෙන ගිහින් තිබුණා. ඒකේ තිබුණේ දවසක ආදායම. එකවුන්ටන්ගේ ලොකර් එක කඩලා ඒකේ තිබුණු ලක්ෂ 18ම අරගෙන ගිහින්. මැනේජර්ගේ එකේ ලක්ෂ 40කට වැඩියෙන් තිබිලා. මගේ ලොකර් එකේ තිබුණා ලක්ෂ 350කට ආසන්න සල්ලි. ඩොලර් ලක්ෂ 2කට වැඩියෙන් තිබුණා. යුරෝ 35,000කට වැඩිය තිබුණා. රත්රන් පවුම් 200කට වැඩිය අරගෙන ගිහින් තිබුණා. හෝටලේ තිබුණු ඔක්කොම සේප්පු කඩලා සල්ලි අරගෙන ගිහින් තිබුණා. මගේ වයිෆ්ගේ, දරුවන්ගේ ඔරලෝසු 10ක් 15ක් විතර අරගෙන ගිහින් තිබුණා. පස්සේ අරන් ගිය අය ගාව තිබිලා ඔරලෝසු තුනක් සොයා ගත්තා. ඒ එක ඔරලෝසුවක් ලක්ෂ 8ක් විතර වටිනවා.



“මම 2008දී තමයි මේ ව්‍යාපාරය පටන් ගත්තේ. අක්කර පහක් තියෙනවා. කාමර 37ක් තියෙනවා. බැන්ක්විට් හෝල් තුනක් තියෙනවා. සම්මන්ත්‍රණ ශාලා තියෙනවා. අවන්හලක් තියෙනවා. නාන තටාක තිබුණා. සැලෝන් එකක්, ඉස්සරහ රෙස්ටුරන්ට් එකක් තිබුණා. මේ සේරම ගිනි තියලා තිබුණා. මම මේවා හැදුවේ හරි හම්බකරලා. කාගේවත් රුපියලක් මෙතැන නැහැ. තියෙන්නේ බැංකුවල සල්ලි. මේ සිද්ධියෙන් දැනට ගණන් බලලා තියෙන විදියට මට කෝටි 200කට වැඩි අලාභයක් වෙලා තියෙනවා.”

“මට තව තියෙනවා වෙන්නප්පුවෙත් හික්කඩුවෙත් හෝටල් දෙකක්. ඒවට මුකුත් කරලා තිබුණේ නැහැ. මට හිතාගන්න බැහැ ඇයි මෙහෙම දෙයක් කළේ කියලා. මට ව්‍යාපාරික හතුරොත් නැහැ. මේක සංවිධානාත්මකව කරපු අපරාධයක්. මිනිස්සු වෛරයකින් කළේ. ඒත් මම කරපු වැරැද්දක් නැහැ.“

ඔහු තවදුරටත් ප්‍රකාශ කළේ මීගමුව පමණක් නොව එදින මුලු ලංකාවේම පොලිසියේ හැසිරීම් සම්බන්ධව කණගාටු වන බවයි. පොලිසිය හරි ආකාරයෙන් මේ සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වූවා නම් අලාභහානි අඩු කරගන්නට හැකියාවක් තිබූ බව ද ඔහු ප්‍රකාශ කර සිටි අතර මෙලෙස ක්‍රියාකරන්නට පොලිසිය සහ හමුදාව වෙත යම්කිසි බලපෑමක් තිබුණා ද යන්නට සැකයක් පවතින බවත් පැවසීය.

ඔහු දේශපාලනය නොකරන බවත් නමුත් දේශපාලනයට සම්බන්ධ කිහිපදෙනෙකු සමඟ මිත්‍රශීලී සම්බන්ධතා පවත්වන බවත් පැවසීය. මෙම හෝටලය මීගමුව නගරාධිපති දයාන් ලංසාට අයිති බවට හා රාජපක්ෂ පවුලට සම්බන්ධ බවට සැකයක් ජනතාව අතර පැතිර තිබිණි.

ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරි සමන් සිගේරා විසින් මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට පොලිස් කණ්ඩායම් හතරක් පත් කර ඇත. මාස එකහමාරක කාලයක් තිස්සේ බුද්ධි තොරතුරු ලබාගනිමින් මේ වන විට පුද්ගලයන් 120කට ආසන්න පිරිසක් මේ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇත. ලැබී ඇති තොරතුරුවලට අනුව මෙම පිරිස හෝටල් සංකීර්ණය කොල්ලකෑමට පැමිණි අයයි. ප්‍රශ්න කිරීමේදී කොල්ලකෑ විශාල දේපළ ප්‍රමාණයක් සොයා ගත හැකි වූ අතර ඒ අතර හෝටලයෙන් පැහැරගෙන ගිය විශාල ට්‍රක් රථයක්ද සොයා ගැනීමට නිලධාරීන්ට හැකි වී ඇත.

මෙම කඩාකප්පල්කාරී ක්‍රියාව හේතුවෙන් මේ වන විට සියයකට වැඩි හෝටල් සේවකයන් පිරිසකට රැකියා ද අහිමිව තිබේ.

## මීගමුව ඩීන් හන්දියේ ජාතිවාදී සිදුවීම

මැයි 9 සිදුවීම් ආශ්‍රිතව ජාතිවාදී ප්‍රවණතාවන් දක්නට ලැබුණේ අවම වශයෙනි. එහෙත්, මීගමුව ඩීන් හන්දිය ප්‍රදේශයේ ප්‍රචණ්ඩ ක්‍රියා තුළ ජාතිවාදී ස්වරූපයක් ද දක්නට ලැබිණි[21].

සිදුවීම අවස්ථාවේ ඒ අසල සිටි රාජේන් ප්‍රනාන්දු මහතාගේ පවසන පරිදි විශාල පිරිසක් කඩු, පිහි සහ පොලු රැගෙන ඩීන් හංදිය දෙසට පැමිණෙද්දී තත්වය සමනය කිරීමට කතෝලික පියතුමන්ලා මැදිහත් වී ඇති නමුත් එය මැඩපවත්වා ගැනීමට නොහැකි වී තිබේ. ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණු පිරිස් මුස්ලිම් ජනතාව ජීවත් වන ප්‍රදේශවලට ගල් මුල් ප්‍රහාර එල්ල කර ඇත. මෙම ගැටුම හේතුවෙන් විශාල සම්පත් හානියක් සිදුව ඇත. ඩීන් හංදියට එම මොහොත වන විට එකතු වූ පිරිසගේ වාහන ද ගිනිතබා ඇත්තේ මුස්ලිම් ජනතාවගේ වාහන යැයි අනුමාන කරමිනි.







තොරතුරු ලබා ගැනීමේ පනත යටතේ ලබාගත් තොරතුරු ලේඛනය
රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානයේ වෙබ් අඩවියෙන්[22] ලබාගත හැකිය.

21. https://youtu.be/sA6Ds3DWEIA
22. www.right2life.lk

# ප්‍රචණ්ඩත්වය, නීතිය හා ජනමාධ්‍ය

අරගලය සහ මැයි 9 වනදා ඇති වූ ප්‍රචණ්ඩකාරී තත්වයන් සම්බන්ධව අදහස් දක්වමින් ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ සභාපති ජනාධිපති නීතීඥ සාලිය පීරිස්[23] මහතා පැවසුවේ නීතීඥ සංගමය රටේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම සමාජ වගකීමක් ලෙස සලකා ඒ අයිතිවාසිකම් උල්ලංඝනය වන විට අවශ්‍ය මැදිහත්වීම් කරන බවයි. එමෙන්ම, පවත්වන උද්ඝෝෂණ සාමකාමීව සහ නීත්‍යානුකූලව නීතියේ රාමුවට අනුව සිදු වන්නේනම් පමණක් ඔවුන්ගේ මැදිහත්වීම සිදුකරන බව නීතීඥ සංගමය අවධාරණය කරයි.

නීතීඥ සංගමය විශේෂයෙන් ම සඳහන් කළ කරුණ වන්නේ යම්කිසි අයුරකින් ප්‍රචණ්ඩත්වයක් ඇති වුවහොත් එම ප්‍රචණ්ඩත්වය විරෝධතාවන්වල විසම්මුතියේ අරමුණු පරාජය කරන ප්‍රචණ්ඩත්වයක් වන බවයි.

ජාතික මට්ටමේ දේශපාලන කටයුතු වල නිරත වූ නීතීඥ සංගමයේ සාමාජිකයන් කිහිපදෙනෙකුගේ නිවාස වලටද මැයි 9 වනදා සිදුවූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් හේතුවෙන් ප්‍රහාර එල්ල වී ඇති අතර නීතීඥ සංගමය ලෙස පොලිස්පති හරහා ප්‍රචණ්ඩකාරීව හැසිරුණු අයට නීතිය ක්‍රියාත්මක කරවීමට ඔවුන් මැදිහත් වී ඇත.

පොලීසිය යනුවෙන් හඳුන්වන්නේ මිනිසුන්ට විය හැකි අනතුරු සාමකාමීව නීතී රාමුවකට යටත්ව වළක්වා ගැනීම සඳහා මහජන සහභාගීත්වය ගැඹුරින් පවතින ආයතනයක් බැවින් එය මහජන සම්බන්ධතාවේ සලකුණක් විය යුතු බව ආසියානු මානව හිමිකම් කොමිසමේ නීතීඥ බැසිල් ප්‍රනාන්දු පවසයි. මැයි 9 වන දා පොලිසිය තමන්ගේ රාජකාරිය ඉටු කර නොමැති අතර ඔවුන්ට නීතියෙන් පැවරී ඇති කාර්යයන් පසෙකලා කිසියම් පාර්ශවයක වුවමනාවන් සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් මැයි 9දා පොලිසිය කටයුතු කර ඇති බව ඔහු චෝදනා කරයි.

''මැයි 9 දා අරලියගහ මැදුරට පැමිණි පිරිස ඉතාමත් පහසුවෙන් පොලිසියට පාලනය කිරීමට හැකියාවක් තිබුණ අතර එය එසේ සිදු වූවානම් ඉන් පසුව සිදු වූ කිසිඳු සිදුවීමක් සිදු නොවන්නට තිබුණි. එම නිසා මැයි 9දා සහ ඉන්පසුව සිදු වූ සියලුම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්වලට අවසාන වශයෙන් වගකිව යුත්තේ ශ්‍රී ලංකා පොලිසියයි. පාලනය කරගත හැකි වූ දෙයක් පාලනය කරගත නොහැකි දෙයක් වන්නේ පොලිසියේ වගකීම් සහගත මැදිහත් වීම නොමැති වූ නිසාවෙනි. මැදිහත් වීම කළ යුතු තැන එය සිදු නොකිරීම සාපරාධී ක්‍රියාවකි.''

අරගල නම් දෙය මනුෂ්‍ය වර්ගයාගේ ආරම්භයේ සිට සිදුවෙමින් පවතින ක්‍රියාවලියක් බවත්, 21වන සියවසය වන විට අරගල ක්ෂේත්‍රයට වැදගත්ම සංරචකයක් ලෙස නව මාධ්‍ය නැතහොත් සමාජ මාධ්‍ය පිවිස ඇති බවත් ජනමාධ්‍ය පිළිබඳ මහාචාර්ය ටියුඩර් වීරසිංහ[24] පෙන්වාදෙයි. ඩිජිටල් තාක්ෂණය ලෝකය පුරාම විසිරපැතිර ගොස්, විසිරුණු පිරිස් ඒකාබද්ධ කිරීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කළ බවත්, 'අරගලය' පැමිණියේ එම අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය වේදිකාව මතට බවත් ඔහු පැවසූවේය. අරගලය සංවිධානය වීමේ, මෙහෙයවීමේ, අවශ්‍ය සාකච්ඡා පවත්වාගෙන යාමේ මූලිකම අවකාශය බවට පත් වුණේ මෙම අවකාශය බවත් එය ඉතා තීරණාත්මක සාධකයක් වූ බවත් ඔහු පෙන්වාදෙයි.

රටේ ආරම්භ වූ 'අරගලයෙහි' පැති දෙකක් පෙන්නුම් කරන අතර පළමුවැන්න ලෙස රට අභ්‍යන්තරයේ අවුරුදු හතළියක් පමණ ක්‍රියාත්මක වූ නව ලිබරල්වාදී ප්‍රතිපත්තිවල ප්‍රතිඵල ලෙස ඇති වූ දේශපාලනික, ආර්ථික අර්බුදය හා පාලනයේ සිටි පලකයන්ගේ අකාර්යක්ෂම පාලනය නිසා ඇති වූ ගැටලු වන අතර, එසේම ආසන්න වශයෙන් භාණ්ඩ හිඟය සමග පුරවැසියාට ඇතිකළ පීඩනය සමග මිනිස්සු ක්‍රමානුකූලව මේ සමාජ මාධ්‍ය භාවිතා කරමින් ඒකරාශි වී අරගලයක් නිර්මාණය විය. සමාජ පරිවර්තන සිදුවන විට ඒවාට යම් නායකත්වයක්, දෘෂ්ටිවාදයක්, අරමුණක් පැවති මුත් මේ 'අරගල'වලට එවැනි විශිෂ්ට අදහසක් නොව සාමන්‍ය අදහසක්වත් නොතිබුණු බව ඔහු පවසයි. එහි දෛනික අරමුණු තිබුණ බවත්, ඒ සමග මිනිසුන් ඒකාබද්ධ වු බවත් ඔහු පෙන්වාදෙයි. එම බලමුළු ගැන්වීමේදී සමාජ මාධ්‍ය අවකාශය ඉතා තීරණාත්මක සාධකයක් වූ බවත්, එය ගෝලීය අරගලයේ නවතම ස්වරූපය බවත් ඔහුගේ අදහසයි.

23. https://youtu.be/yrgBZCm_N2M
24. https://youtu.be/99bqZ6A6jWw

## හානිපූරණය

මැයි 9 වනදා රට පුරා පැතිරී ගිය ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ල හේතුවෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන ඇතැම් මැති ඇමතිවරුන්ගේ නිවාස සහ දේපළවලට හානි විය. මෙලෙස විනාශ වූ දේපළ සඳහා රජය විසින් වන්දිගෙවිය යුතු බවට කැබිනට් මණ්ඩලය තීරණය කිරීමත් සමගම දේශපාලන පක්ෂ හා ජනමාධ්‍ය වෙතින් ඒ පිළිබඳ විරෝධය එල්ල විය. එහිදී, එම දේපළ හිමි දේශපාලකයන් එම දේපළ උපයාගත් ආකාරය ද ප්‍රශ්න කළ යුතු බව ඔවුන් විසින් අවධාරණය කරනු දක්නට හැකි විය.

උදාහරණයක් ලෙස හිරු නිව්ස්[25] වෙබ් අඩවිය වාර්තා මෙසේ වාර්තා කරයි.''විනාශයට පත් වූ දේපළ වෙනුවෙන් අධික තක්සේරු වාර්තා ඉදිරිපත් කරමින් අසීමිත වන්දි මුදල් ලබා ගැනීමට ඇතැම් දේශපාලයකයන් උත්සාහ දරන නිසාවෙන් රජයේ තක්සේරු නිලධාරීන් ද දැඩි අපහසුතාවයකට පත්ව ඇත. කෙසේවෙතත් මෙම දේපළ හානි සිදුවීම සම්බන්ධයෙන් විමර්ශන පවත්වන පොලිස් කණ්ඩායම් පවා පවසන්නේ මෙලෙස විවිධ දේශපාලකයන් විසින් ඉදිරිපත් කර ඇති හානි වාර්තා බොහොමයක් පිළිගත හැකි ඒවා නොවන බවය.

''එමෙන්ම මෙම දේශපාලකයන් විනාශයට පත් වූ තම දේපළ වෙනුවෙන් අසීමිත වන්දි ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් මොවුන් එම දේපළ ඉපයූ ආකාරය පිළිබඳව කිසිදු විමසීමක්, විගණනයක් හෝ පරීක්ෂණයක් කිරීමට මේ වනතුරු රජය පාර්ශ්වයෙන් කිසි කටයුත්තක් සිදු වී නොමැති බවත් එම විමර්ශන කණ්ඩායම් වැඩිදුරටත් පවසා සිටියි. ඔවුන් පෙන්වා දෙන්නේ මෙම සියලු තක්සේරු වාර්තා රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව හරහා සියුම්ව විගණනය කර එම ඉපයුම් සම්බන්ධයෙන් ආදායම් බදු පැනවීමට කටයුතු කළ යුතු බවයි. රජය විසින් එවැනි පියවරක් අනුගමනය කරන්නේ නම් මෙලෙස ව්‍යාජ තක්සේරු වාර්තා ඉදිරිපත් කරනු ලබන සියලු දේශපාලකයින් එම තක්සේරු වාර්තා ඉවත් කරගනු ඇති බවට ද ඔවුහු විශ්වාසය පළ කර සිටිති.''

කෙසේ වෙතත්, මෙම කරුණ දේපළ විනාශ වූ සියලු දේශපාලකයන්ට අදාළ වන්නේ නැත.

25. www.hirunews.lk

# අධ්‍යයනයේ නිර්දේශ

1. මැයි 9, 10 හා ඒ ආසන්න දිනවල රට පුරා සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් සිදුකළ යුතුය. ඒ සම්බන්ධයෙන් සියලු විමර්ශනවලින් හෙළිවූ තොරතුරු හා දුක්ගැනවිලි ලේඛනගත කිරීම සඳහාත්, අවශ්‍ය පියවර ගැනීම සඳහාත් සත්‍ය කොමිසමක් වැනි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

2. මෙම දිනවලදී මහජනතාවට ආරක්ෂාව සැපයීමට සහ නීති විරෝධී ක්‍රියා සිදුවීම වැළැක්වීම සඳහා පොලිසිය සහ සෙසු ආරක්ෂක අංශ ක්‍රියාත්මක වීමට අසමත් වූයේ මන්ද යන්න පිළිබඳ විශේෂ විමර්ශනයක් සිදුකිරීම

3. මෙම සමස්ත ක්‍රියාවලිය තුළම එවකට සිටි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ ආණ්ඩුවේ සහ ජ්‍යේෂ්ඨ රාජ්‍ය නිලධාරීන්ගේ වගකීම හෝ වගකීම් විරහිතභාවය පිළිබඳ විශේෂ විමර්ශනයක් පැවැත්වීම

4. ප්‍රචණ්ඩ ක්‍රියාවලට සහභාගී වූ සියලුදෙනා නීතිය ඉදිරියට පැමිණවීම

5. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය හා සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචණ්ඩ ක්‍රියා දිරිගැන්වූ බලවේග හඳුනාගෙන නීති විරෝධී ක්‍රියා සිදුවී තිබේ නම්, ඔවුන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීම සහ ආචාරධාර්මික වාර්තාකරණය සම්බන්ධයෙන් එම මාධ්‍ය හා මාධ්‍යකරුවන් වගවීමට යටත් කිරීම

6. ප්‍රචණ්ඩ ක්‍රියාවලට සුළු වශයෙන් දායක වූ පිරිස් හඳුනාගෙන, කොන්දේසි සහිත සමාවක් යටතේ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම

7. ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් සිදුවූ හානිය ජාතික මට්ටමෙන් නිවැරදිව තක්සේරු කිරීම හා එම සංඛ්‍යාලේඛන රටට හෙළිදරව් කිරීම

8. ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් පුද්ගලයන්ට සාධාරණ වන්දි ලබාදීමේ හානිපූරණ ක්‍රියාවලියක් ආරම්භ කිරීම

9. මහජන වෛරයට තුඩුදුන් දේශපාලන, සමාජ, සංස්කෘතික හා මනෝවිද්‍යාත්මක සාධක පිළිබඳ අධ්‍යයනය කර ඒ පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයන් හා සමාජ නායකයන් දැනුවත් කිරීම

10. පශ්චාත් ගැටුම් සාමය ගොඩනැගීමේ හා සංහිඳියා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම



**Right to Life Human Rights Centre**
No. 56/02, Palitha Place, Colombo 09.
Tel/ Fax : 011 266 9100
E-mail : right2lifelk@gmail.com
Web : www.right2lifelanka.org